KALUBOWITIYANA TEA

# වාර්ෂික වාර්තාව
# 2016/17

සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

**පටුන**


| | |
|---|---|
| සංස්ථාමය තොරතුරු, හැඳින්වීම, දැක්ම, මෙහෙවර හා ව්‍යුහය | *1 - 4* |
| සභාපතිතුමාගේ සමාලෝචනය සහ මූල්‍ය සමාලෝචනය | *5 - 8* |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | *9 - 10* |
| විගණකවරුන්ගේ වාර්තාව | *11 - 23* |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | *24* |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | *25* |
| ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | *26* |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | *27* |
| මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති | *28 - 36* |
| ගිණුම් සඳහා සටහන් | *37 - 49* |
| * පූර්ව වසර දහය සඳහා විශේෂ මූල්‍ය සිදුවීම් | *50* |
| මෙහෙයුම් තොරතුරු | *51* |
| * කර්මාන්තශාලා අනුව ලාභ/(අලාභ) පිළිබඳ විස්තර | *52-53* |
| *මාසික තේ නිෂ්පාදන විස්තර | *54* |
| *වාර්ෂික තේ නිෂ්පාදන විස්තර | *55* |
| *මාසික දළු සැපයුම් විස්තර | *56* |
| *වාර්ෂික දළු සැපයුම් විස්තර | *57* |
| *සැසඳුම් විස්තර-නිෂ්පාදන | *58* |
| *සැසඳුම් විස්තර-අලෙවි සාමාන්‍ය | *59* |
| පුහුණුව සහ සංවර්ධනය | *60 -62* |
| * ඉහළම මිළ ගණන් | *63* |

# සංස්ථාමය තොරතුරු

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම |
| සමාගම් ලියාපදිංචි අංකය | : | PB 1020 |
| වත්මන් ලිපිනය | : | අංක 556, නාගහමුල්ල පාර, පන්නිපිටිය පාර, තලංගම දකුණ, පැලවත්ත, බත්තරමුල්ල. |
| නෛතික ස්වභාවය | : | සීමාසහිත පොදු සමාගමකි.<br>1992 සැප්තැම්බර් 30 දින සංස්ථාගත කරන ලදී |
| දුරකථන අංක | : | 0114645279 |
| ෆැක්ස් අංකය | : | 0114645279 |
| විද්‍යුත් තැපැල | : | zktfl@sltnet.lk |
| විගණකවරු | : | විගණකාධිපති,<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව,<br>අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. |
| ලේකම්වරු | : | කෝපරේට් සර්විසස් සමාගම,<br>216, ද සේරම් පෙදෙස, කොළඹ 10 |
| නීතිඥවරු | : | එෆ්. ජේ සහ ජී. ඩී. සේරම්<br>නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්<br>216, ද සේරම් පෙදෙස, කොළඹ 10 |
| බැංකුකරුවෝ | : | මහජන බැංකුව |
| අධ්‍යක්ෂ මණ්ඩලය | : | පී. එස්. සමරකෝන් මහතා සභාපති<br>එස්. එන්. අත්තනායන මිය කළමනාකරණ අධ්‍යක්ෂ (වැඩ බලන)<br>හේමාල් කස්තුරිආරච්චි මයා<br>ධම්මික අඹේවෙල මයා<br>ඒ.යූ.සී. අතුකෝරාළ මයා<br>එම්.ඒ.එල්.එච්.එන්.කේ. මන්ත්‍රීනායක මයා<br>ඩබ්ලිව්.ඒ.ඉන්ද්‍රානි සුගතදාස මිය<br>එම්.ඒ.එස්.පී. පළිහවඩන මයා<br>පී. රාසයියා මයා<br>ටී.පී. රත්නායක මයා<br>ගාමිණී නල්ලපෙරුම මයා<br>කේ. බ්‍රාහ්මණ මයා |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | : | පී.ජයසේකර මහතා (කළමනාකරු මූල්‍ය සහ අලෙවි)<br>ටී.ඩබ්ලිව්.එම්.එස්.පී. බණ්ඩාර මහතා (කළමනාකරු පරිපාලන හා මානව සම්පත්)<br>ටී.ඒ.ඩී.ජේ.සී. තිලකරත්න මහතා (කළමනාකරු/කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව)<br>තුසිත සිරිවර්ධන මහතා (කළමනාකරු / දැරංගල තේ කර්මාන්තශාලා සමාගම)<br>එල්.ඒ.ඩී.ඩී. නන්දසිරි මහතා (සහකාර කළමනාකරු /හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව)<br>ජයලාල් වීරකෝන් මහතා ( කළමනාකරු / මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාව) |
| කර්මාන්ත ශාලා | : | කළුබෝවිටියාන CTC කර්මාන්ත ශාලාව<br>අබේවිල, කළුබෝවිටියාන<br>දු.ක. / ෆැක්ස් : 0913 783020<br>විද්‍යුත් තැපැල ktflk@sltnet.lk<br><br>හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව<br>ජැස්මින් වැලි හන්දිය, තවලම<br>දුරකථන/ ෆැක්ස්. : 0417201222<br><br>දැරංගල තේ කර්මාන්ත ශාලාව<br>කිරිවැල්කැලේ, පිටබැද්දර<br>දුර/ෆැක්ස්. : 0913 783621<br>විද්‍යුත් තැපැල dtf@sltnet.lk<br><br>මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාව<br>තිස්මඩ පාර, මැණික්දිවෙල.<br>දුර/ෆැක්ස්. : 0812069620/21 |

## හැඳින්වීම

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත ස 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සීමිත බැඳීම් සමාගමකි. සමාගම ස්ථාපිත කරනු ලැබූයේ සී.ටී.සී. තේ නිපදවීම සඳහා වන අතර කොටසක් රු.10 ක් ලෙස කොටසක් රු.10 බැගින් තක්සේරු කරන ලද කොටස් මිලියන පහක් ලෙස රුපියල් මිලියන 50 කින් සමන්විත ආරම්භක ප්‍රාග්ධනයකින් එය 1994 අගෝස්තු 1 වන දින වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලදී. ඉන්දීය ණය ආධාර යටතේ ආරම්භක ප්‍රාග්ධනය සපයන ලදී. ඒ අන්දමින්ම ඉන්දීය ණය ආධාර යටතේ අපගේ දෙවන කර්මාන්ත ශාලාව වූ දැරංගල තේ කර්මාන්ත ශාලාව ද ස්ථාපිත කරන ලද අතර 2000 මාර්තු මාසයේදී මෙහෙයුම් ආරම්භ කරන ලදී.  කලින් තේ ශක්ති අරමුදල යටතේ පැවැති අපගේ තෙවන කර්මාන්ත ශාලාව වූ හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව ලාභ බෙදාහදා ගැනීමේ ගිවිසුමක් යටතේ කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට පවරන ලදී. තමන්ගේම අරමුදල් යොදා ගනිමින්  සමාගම මෙම කර්මාන්ත ශාලාව නැවැත ස්ථාපිත කරනු ලැබූ අතර හිනිදුම තේ කර්මාන්ත ශාලාව 2012 වසරේ සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී.

සමාගමට අළුතින්ම එකතු වූ මැණික්දිවෙල කර්මාන්ත ශාලාව කලින් තේ ශක්ති පදනමට හිමිව තිබූ අතර එය මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ඡන්ද කොට්ඨාශයේ මැණික්දිවෙල ගම්මානයේ පිහිටා ඇත. මෙම කර්මාන්ත ශාලාව නැවත ස්ථාපිත කිරීම සඳහා සමාගම .තමන්ගේම අරමුදල් භාවිතා කරන ලදී.

කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදී ගත් තෝරාගත් අමු දළු යොදා ගනිමින් සමාගම ආසන්න වශයෙන් ඉතා උසස් තත්වයේ තේ කිලෝග්‍රෑම් 2,000,000 ක් වාර්ෂිකව නිපදවයි.

සමාගමේ තේ නිපැයුම තැරැව්කරුවන් හරහා කොළඹ තේ වෙන්දේසිය වෙත යොමු කරන අතර සුළු ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ සහ කර්මාන්ත ශාලාවල ඇති අලෙවි මධ්‍යස්ථාන හරහා දේශීය වෙළඳපොළ තුල අලෙවි කරනු ලැබේ. සංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව සමාගමේ විධිනියෝගය පහත දැක්වෙන පරිදි වේ.

- වගාකරුවන්ගෙන් මිලදී ගත් තේ දළු පිරියම් කිරීම, පිරිසැකසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය  සිදු කිරීම.
- තේ සිටුවීම, වගා කිරීම සහ තේ වතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.

## වෙළඳ නාම සහ තේ වර්ග

ගුණාත්මකභාවය අතින් ගත් කළ රටේ පහත රට ප්‍රදේශයේ අංක එකේ සීටීසී තේ නිෂ්පාදකයා වනුයේ කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමයි.

- "කළුබෝවිටියාන තේ" විකුණුම් ලකුණ යටතේ කළුබෝවිටියාන සීටීසී තේ වෙළඳ පොලෙහි අලෙවි කරනු ලැබේ.
- "දැරංගල" සහ "කිරිවැල්කැලේ" තේ විකුණුම් ලකුණ යටතේ දැරංගල සම්ප්‍රදායික තේ වෙළඳ පොලෙහි අලෙවි කරනු ලැබේ.
- "හිනිදුම හිල්ස්" සහ "තවලම හිල්ස්" තේ විකුණුම් ලකුණ යටතේ හිනිදුම  සම්ප්‍රදායික තේ වෙළඳ පොලෙහි අලෙවි කරනු ලැබේ.
- "මැණික්දිවෙල" තේ විකුණුම් ලකුණ යටතේ මැණික්දිවෙල සම්ප්‍රදායික තේ වෙළඳ පොලෙහි අලෙවි කරනු ලැබේ.

## දැක්ම

හොඳම ශ්‍රී ලාංකික සීටීසී හා සම්ප්‍රදායික තේ නිපදවීමේ හා අලෙවි කිරීමේ වඩාත්ම පිළිගත් ආදර්ශය බවට පත්වීම.

## මෙහෙවර

දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගනිමින් ඉහළ ගුණාත්මකබවින් යුත් රසවත් හා පාරිභෝගික හිතකාමී ශ්‍රී ලාංකික තේ නිෂ්පාදනය කිරීම

# සංවිධාන ව්‍යුහය


සභාපති/අධක්ෂ මණ්ඩලය
කළමනාකරණ අධ්‍යක්ෂ
කළමනාකරු
(මා.ස. සහ පරිපාලන)
කළමනාකරු
(මූල්‍ය සහ අලෙවි)
කර්මාන්තශාලා කළමනාකරුවෝ
(4)
අභ්‍යන්තර විගණන
නිලධාරී (1)
පරිපාලන නිලධාරී (1)
සහකාර කළමනාකරු අලෙවි
සහකාර කළමනාකරු මූල්‍ය
සහකාර කර්මාන්තශාලා
කළමනාකරුවෝ (3)
කළමනාකරණ සහකාර
(2)
රියදුරු (02)
කාර්යාල කාර්ය සහායක
(02)
කම්කරු (02)
වෙළඳ සහායක (2)
ගණකාධිකාරී සහායක (2)
කළමනාකරණ
සහකාර (3)

## කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම
## ආයතනික කළමනාකාරිත්වය

**එම්.එන්. ජයවර්ධන මයා**
කළමනාකරණ අධ්‍යක්ෂ

**එම්.ඒ.එස්.පී. පළිහවඩන මයා**
විධායක අධ්‍යක්ෂ

**පී. ජයසේකර මහතා**
(කළමනාකරු මූල්‍ය සහ අලෙවි)

**ටී. ඩබ්ලිව්. එම්. එස්. පී. බණ්ඩාර මහතා**
(කළමනාකරු පරිපාලන හා මානව සම්පත්)

**ටී. ඒ. ඩී. ජේ. සී. තිලකරත්න මහතා**
(කළමනාකරු / කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව)

**ටී. සිරිවර්ධන මහතා**
(කළමනාකරු / දැරංගල තේ කර්මාන්තශාලා සමාගම)

**එල්. ඒ. ඩී. ඩී. නන්දසිරි මහතා**
(සහකාර කළමනාකරු /හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව)

**ජේ. වීරකෝන් මහතා**
(කළමනාකරු /මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාව)

# සභාපතිගේ සමාලෝචනය

**2017 මාර්තු 31න් අවසන් වූ මුල්‍ය වසර සඳහා වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. සමාලෝචිත කාල පරිච්ඡේදය ශ්‍රී ලංකා තේ කර්මාන්තයට බෙහෙවින් අභියෝගාත්මක එකක් වුණි. 2015 සිට ඉදිරියට රැගෙන ආ ගෝලීය පරිමාණයෙන් පැවැති සීඝ්‍රයෙන් වෙනස්වන සහ පුරෝකථනය කළ නොහැකි ක්ෂුද්‍ර ආර්ථික තත්ත්වයන් සහ වත්මන් වසරේ දෙවන කාර්තුවේ පැවැති අයහපත් කාලගුණය, තේ කර්මාන්තයේ මන්දගාමී වර්ධනයට හේතු කාරක විය. නිෂ්පාදනයේ පසුබෑම මත, වර්ෂය තුළ තේ අපනයන ඉපැයුම්, පසුගිය වසරේ අපනයන ආදායමින් 12.7%ක් නියෝජනය කළ ඇ.ඩො. මිලියන 1.340 හා සැසඳීමේදී මුළු අපනයන ආදායමෙන් 12.3%ක් නියෝජනය කරමින් ඇ.ඩො. බිලියන 1.269ක් විය.**

**ගෝලීය අභියෝග**

**2016 වසර සඳහා ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනය කි.ග්‍රෑම් මිලියන 292.6, පසුගිය වසරේ කි.ග්‍රෑ. මිලියන 328 හා සැසඳීමේදී 11%ක අඩුවීමක් පෙන්නුම් කරන අතර වසර හතකින් වාර්තා වූ අඩුම තේ නිෂ්පාදනය ද විය. නිෂ්පාදනයේ මෙම පසුබෑම සහ අයහපත් කාලගුණ රටාවේ ප්‍රතිඵලයක් ලෙස තේ අපනයනය, පෙර වසරේ කි.ග්‍රෑ. මිලියන 306.9ට සාපේක්ෂව කි.ග්‍රෑ. මිලියන 288.8 දක්වා 6% කින් පහත වැටුණි.**
**ගෝලීය වශයෙන් ගත් කළ, රුසියානු වෙළඳපොළ නැවත යථා තත්වයට පත්වීමේ ලකුණු පෙන්නුම් කළ අතර රුසියාව ශ්‍රී ලංකාවේ විශාලතම තේ ආනයකරු වශයෙන් ඉස්මතු විය. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රූබලය ශක්තිමත් වීම සහ 2017 වසර තුළ බොර තෙල් මිල සැළකියයුතු ලෙස ඉහළ යාම, රුසියාව ශ්‍රී ලංකාවෙන් වැඩි වශයෙන් තේ මිලයට ගැනීම සඳහා දායක වුණි. දෙවන සහ තෙවන වැඩිම ගැනුම්කරුවන් වූයේ අනුපිළිවෙලින් ඉරානය සහ ඉරාකයයි. කලාපයේ පැවැති දේශපාලන අස්ථාවරභාවය හේතුවෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කුවේටය, සිරියාව සහ ලිබියාව යන රටවලට තේ අපනයන ධාරිතාවන් සැළකිය යුතු ලෙස අඩු විය.**

**සමාගමේ කාර්යසාධනය**

**මෙම අභියෝගාත්මක පසුබිම මධ්‍යයෙහි වුවද, පිරිවැටුමෙහි 20.6%ක සහ ලාභයෙහි 201% ක වර්ධනයක් සනිටුහන් කරමින් සමාගම සමාලෝචිත වර්ෂය තුළ රු මිලියන 935ක ආදායමක් සහ රු.මිලියන 29.5ක පශ්චාත් බදු ලාභයක් වාර්තා කරන ලදී.**

**අපගේ උපායමාර්ගය**

**ගුණාත්මකබවින් ඉහළ නිමි නිෂ්පාදන නිපැයුම පිණිස අපගේ මූලික ඉලක්කය පහත දැක්වෙන යහපත් නිෂ්පාදන පරිචයන්ගෙන් සමන්විත වේ. මෙම සංදර්භය තුළ, සමාගමේ අවසන් අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අමුද්‍රව්‍ය, පිරිසැකසුම සහ අලෙවිකරණය මත ගුණාත්මක පරාමිතීන් සඳහා කළමනාකාරිත්වය නායකත්වය ලබා දෙයි.** උපායමාර්ගික දෘෂ්ඨියෙන් ගත්කළ, අස්වැන්න ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් ලෙස යහපත් කෘෂිකාර්මික සහ නිෂ්පාදන පරිචයන් සම්බන්ධයෙන් කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීමට හා දැනුම ඉහළ නැංවීමට හා එමගින් අවසාන නිෂ්පාදිතයට වඩා ඉහළ අධිමිලක් එක් කිරීමට සමාගම අදහස් කරයි. රන්දළු සමිති හඳුන්වාදීම මගින් කුඩා තේ වතු අංශය සමග යහපත් සබඳතා ඇති කර ගැනීමට සමාගම අදහස් කරන අතර දේශීය සන්නාමයක් හඳුන්වා දීම ඉදිරි සම්භාවිතාවයකි. දැනුවත්බව හා අවබෝධය පුළුල් කිරීමේ ක්‍රමයක් ලෙස, දැනුම වර්ධනය හා සමස්ත ඵලදායීතාවය වර්ධනය කිරීම පිණිස කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව සිය විධායක කාර්ය මණ්ඩලය සහ සේවකයන් සඳහා අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නියමිතය. **ශක්තිමත් මූලධර්ම මත සමාගම අඛණ්ඩව සිය මෙහෙයුම් පවත්වාගෙන යන අතර සේවක පිරිස තම වටිනාම වත්කම සේ සලකයි.**

## අනාගත අපේක්ෂා

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය අභියෝගාත්මක එකක් සේ පෙනේ. බහුතරයක් තෙල් නිෂ්පාදන රටවල් වන අපගේ ප්‍රධාන පෙළේ ගැනුම්කාර වෙළඳපොළ තුළ පවත්නා අභ්‍යන්තර සහ වෙළඳ තත්වයන් තීරණාත්මක සාධක වේ. හීන වෙමින් පවතින රූබලයේ අගය සහ පහත වැටෙමින් පවතින තෙල් මිල කෙරෙහි දැඩි අවධානයෙන් පසු විය යුතුය. ධනාත්මක සාධකයක් වනුයේ, වාසිදායක තීරු බදු සහන ලබා ගැනීමට හැකියාව ඇති වන ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකත්වය 2014 වසරේදී රුසියාව හිමිකර ගැනීමයි. සම්බාධක පැනවීමට පෙර ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම තේ ගැනුම්කරුවා වූ ඉරානය සහ එක්සත් ජනපදය අතර උණුසුම්කාරී තත්වයේ අඩුවීමත් සමග ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ හිමිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, පොදුවේ මැද පෙරදිග පවතින සමාජ- ආර්ථික අර්බුදය කණස්සල්ලට හේතුවන කරුණක් වී තිබේ.

දේශීය වශයෙන් ගත් කළ, දේශගුණික තත්වයන්, කම්කරු වැටුප් සහ පොහොර සහනාධාරය අභියෝගයක් ලෙස දිගටම පවතින අතර ඒ සඳහා වඩා හොද කළමනාකරණයක් අවශ්‍ය වේ. වසර පුරාම ආකර්ෂණීය සහ නොකඩවා පොහොර සහනාධාරය ලබා දුන්න ද, කුඩා තේ වතු හිමියන් මුහුණ පා ඇති අභියෝගයක් වනුයේ ගුණාත්මක තත්වයේ පොහොර ලබා ගැනීමයි.

## ස්තූතිය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, අපගේ කටයුතුවල සාර්ථකත්වය සඳහා අප විශ්වාසය තබා කටයුතු කරන කුඩා තේ වතු හිමි අංශය මෙන්ම අපගේ මෙහෙයුම් සාර්ථකව අඛණ්ඩව ඉදිරියට මෙහෙයවන කළුබෝවිටියානේ අපගේ කාර්ය මණ්ඩලය සහ කළමනාකාරිත්වය වෙත මාගේ ප්‍රසාදය පළකරමි. අප වෙත ලබා දුන් නොමසුරු සහයෝගය වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත මාගේ ස්තූතිය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. එළඹෙන වසර බොහෝ අංශවලින් අභියෝග පිරි එකක් වුවද, විශ්වාසයෙන් යුතුව ඉදිරියට යාමේ අධිෂ්ඨානය අප වෙත ලබා දෙන අපගේ සේවකයන්ගේ, පාර්ශවකරුවන් සහ ඔවුන්ගේ ශක්තිමත් හවුල්කාරිත්වයේ ශක්තිය හා පක්ෂපාතිත්වයෙන් මම විශ්වාසය ලබන්නෙමි.



පී. එස්. සමරකෝන්

සභාපති

## මූල්‍ය සමාලෝචනය

**ආදායම් විශ්ලේෂණය**

ඉකුත් මූල්‍ය වසරේ ඉපැයූ රු. මිලියන 776ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමාගම වාර්තා කළ දළ ආදායම රු. මිලියන 936 ක් වූ අතර එය පෙර වසර හා සැසඳීමේදී 20.61%ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ඵලදා නිමැවුම සඳහා බලපෑ අහිතකර කාලගුණය, රුසියාවේ ඇතැම් ගැනුම්කරුවන කෙන්යාවෙන් සීටීසී තේ මිලට කැනීම සඳහා යොමුවීම සහ තම තේ හැකිතාක් දුරට කුඩා තේ වතු අංශයෙන් ලබාගැනීම සඳහා තේ කර්මාන්ත ශාලා අතර පැවැති දැඩි තරඟකාරිත්වය පෙර වසරේ මෙන්ම මේ වසරේදී ද පැවැති ප්‍රධාන අභියෝග විය. ආදායම් සංරචකය ගත්කළ, රු. මිලියන 48.78 කින් සමන්විත වූ දේශීය අලෙවිය පෙර වසරට සාපේක්ෂව87% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. රජයේ ආයතන සහ සුබසාධක සංගම් වැඩි වශයෙන් අපගේ තේ මිලයට ගැනීම මේ සඳහා හේතු කාරක විය.

**විකුණුම් පිරිවැය හා මෙහෙයුම් වියදම්**

රු. මිලියන 881.6 ක් වූ විකුණුම් පිරිවැය පෙර මූල්‍ය වසරට සාපේක්ෂව 14.8% ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. සෑම වසරකම එක හා සමාන තේ ප්‍රමාණයක් නිෂ්පාදනය කළ ද දළු පිරිවැයට අදාළව තම නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීමට සමාගම සමත් විය. ඒ සඳහා හේතු වූයේ වඩා උසස් පිරිසැකසුම් කාර්යක්ෂමතාවක් සඳහා උණු ජල ජනක යන්ත්‍රයක් කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාවේ ස්ථාපිත කිරීමය. සමාගම විසින් වඩා ඉහළ ගුණාත්මකබවක් සහ ඵලදායීතාවක් සාක්ෂාත් කරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස දළ ලාභ ආන්තික පෙර වසරට වඩා 544%ක වැඩිවීමක් වාර්තා කරන ලදී.

බහුවිධ වියදම් සංරචකයන්ගේ ඉහළයාමට අනුකූලව පරිපාලන වියදම් ඉකුත් වසරේ රු. මිලියන 30.5ට සාපේක්ෂව රු. මිලියන 32.4 දක්වා දක්වා වැඩි විය. කාර්ය මණ්ඩල වැටුප් ප්‍රමාණ වැඩිවීමට අනුව පිරිස් පිරිවැය ඉහළ යන ලදී.

**අනෙකුත් මෙහෙයුම් ආදායම්**

අනෙකුත් මෙහෙයුම් ආදායම්, ඉකුත් මූල්‍ය වසරේ වාර්තා වූ රු. මිලියන 31.4 සිට රු.මිලියන 7.5 දක්වා අඩු විය. වෙනත් ආදායමක් ලෙස පෙන්නුම් කරන රු. මිලියන 23.2 ක සංරචකය භාණ්ඩාගාර ප්‍රදානය නියෝජනය කරන අතර එය පෙර වසරේදී ලියා හරින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් ආදායම ඉකුත් වසරේ වාර්තා වූ රු මිලියන 8.4 සිට රු. මිලියන 28.2 දක්වා වැඩි වුණි.

**මූල්‍ය පිරිවැය**

වර්ෂය තුලදී සමාගමේ මූල්‍ය වියදම් රු. මිලියන 9.1 ක් වුණි. ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළදී සමාගම රු. මිලියන 12.01 ක පොළී ආදායමක් උපයන ලදී. 2003 වසරේදී බීසීසී ලංකා ආයතනය වෙත සමාගම ලබාදුන් ණය ශේෂ පත්‍රයේ දිගටම පැවැති අතර එමගින් සමාගමට පොළී ආදායමක් උත්පාදනය වුණි.

ඉකුත් මුදල් වසරේ රුපියල් මිලියන 3.5ට සාපේක්ෂව සමාගම රු. මිලියන 2.9 ක ශුද්ධ මූල්‍ය ආදායමක් වාර්තා කරන ලදී. පොළී ආවරණය කලින් පැවැති 2.4 සිට 4.4 දක්වා වැඩි විය.

බදු ගෙවීමෙන් පසුව, 2015/16 න් අවසන් මුදල් වර්ෂයේ රු. මිලියන 9.81 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව මේ වසරේ ශුද්ධ ලාභය රු. මිලියන 29.5 දක්වා 201% ක වර්ධනයක් සමාගම වාර්තා කරන ලදී.

**මූල්‍ය තත්වය හා ද්‍රවශීලතාව**

**ජංගම නොවන වත්කම්**

ජංගම නොවන වත්කම් මුළු වත්කම් පදනමින් 34.5%කින් සමන්විය විය. සමාලෝචිත මුදල් වර්ෂය තුළදී මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාව සංවර්ධනය කිරීම පිණිස සමාගම රු. මිලියන 76 ක් වූ පිරිවැයක් ආයෝජනය කරන ලදී. එම කර්මාන්ත ශාලාව ලබාගන්නා ලද්දේ තේ ශක්ති පදනමිනි.

**ණය - බීසීසී ලංකා සමාගම**

2004 වසරේදී බීසීසී ලංකා සමාගම වෙත ලබාදෙන ලද රු. මිලියන 10 ක ණය මුදල හා ඒ සඳහා සමුච්චිත පොළිය වන රු. මිලියන 37.73 ( මුළු මුදල රු. මිලියන 47.73) ආපසු අයකර ගැනීම සඳහා සමාගම ප්‍රයත්න කිහිපයක් දැරුවද ඒ කිසිවක් සාර්ථක නොවීය.

**කාරක ප්‍රාග්ධනය**

ශේෂ පත්‍ර දිනයට තොග භාණ්ඩවල වෙළඳපොළ වටිනාකම පොදුවේ පහත වැටීම හේතුවෙන් වර්ෂය තුළදී සමාගමේ ජංගම වත්කම් පෙර වසරේ පැවැති රු. මිලියන 349.16 සිට රු. මිලියන 415.27 දක්වා සැළකිය යුතු ලෙස ඉහළ නැංවුණි. රු. මිලියන 49.9ක් වූ වෙළඳ ණයගැති සංරචකය රු. මිලියන 62.3 දක්වා වැඩි වුණි. 'වෙළඳ ගෙවිය යුතු දෑ' ප්‍රමාණය පෙර වසරවල පැවැති රු මිලියන 69.1 සිට රු. මිලියන 89.2 දක්වා දක්වා ඉහළ යන ලදී. එබැවින් සමාගම සිය කාරක ප්‍රාග්ධන චක්‍රය සතුටුදායක සීමාවන් තළ කළමනාකරණය කරගන්නා ලදී.

**ප්‍රාග්ධන ව්‍යුහය**

**සාමාන්‍ය කොටස් ප්‍රමාණය**

සමාගම රු. 46,375,070.00 ක වටිනාකමක් සහිත සාමාන්‍ය ප්‍රාග්ධන කොටස් නිකුත් කරන ලදී. ඉදිරියට රැගෙන ආ ලාභ මගින් සමාලෝචිත මුදල් වර්ෂය සඳහා රඳවාගත් ඉපැයුම් හා සංචිත ප්‍රවර්ධනය කරනු ලැබූ අතර එමගින් ප්‍රවර්තන මුදල් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් රු. මිලියන 465 දක්වා 6%කින් ඉහළ නැංවුණි.

**ණය ගැනීම්**

සමාගම රු මිලියන 55ක් වූ කාරක ප්‍රාග්ධනය ණයක් මහජන බැංකුවෙන් ලබාගත් අතර ඒ සඳහා තේ ශක්ති පදනම 2%ක පොළී සහනාධාරයක් ලබා දෙන ලදී.

මෙය සමාගමේ බැංකු අයිරා පොළී ගෙවීම් ප්‍රමාණය 11.15% සිට 8% දක්වා අඩු කිරීමට හේතු විය.

## *සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව*

<u>ව්‍යාපාරයේ ස්වභාවය</u>

**සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයතු වනුයේ වගාකරුවන්ගෙන් මිලදී ගත් තේ දළු පිරියම් කිරීමේ, කල් තබා ගත හැකි ලෙස සකස් කිරීමේ, පිළියෙල කිරීමේ, පිරිසැකසුම් කිරීමේ සහ අලෙවි කිරීමේ නිරත වීම සහ තේ වගා කිරිම, සිටුවීම සහ තේ වතු කළමනාකරණය කිරිම සහ පාලනය කිරිම වේ.**

<u>සමාගමේ කාර්යසාධනය</u>

**වාර්ෂික වාර්තාවේ කොටසක් සම්පාදනය කරන්නා වූ විගණන වාර්තාව ද ඇතුළුව (මීට අමුණා ඇති) මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ අදහස් දැක්වීම් සහිතව වර්ෂය තුළ සමාගමේ කටයුතු සහ එහි කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය මූල්‍ය ප්‍රකාශනයන්හි අන්තර්ගත වේ.**

**මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 28 සිට 36 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්වල දක්වා තිබේ.**

<u>ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්</u>

**සමාගම විසින් කලින් වසරේ අනුගමනය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල කිසිදු වෙනසක් නොමැතිව සංගතව ආදේශ කර තිබේ.**

<u>අධ්‍යක්ෂවරුන් කොටස් දැරීම පිළිබඳ ලේඛනය</u>

**අධ්‍යක්ෂවරු කොටස් දැරීම පිළිබඳ සිදුකළ සටහන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල 45 වන පිටුවේ "සම්බන්ධිත පාර්ශව ගනුදෙනු" මාතෘකාව යටතේ හෙළිදරව් කොට ඇත.**

<u>අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිලාභ</u>

**2017 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි 38 වන පිටුවෙහි විස්තර කොට ඇත.**

<u>පරිත්‍යාග</u>

**2017 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා සමාගමේ මුළු පරිත්‍යාග, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි 39 වන පිටුවෙහි පෙන්නුම් කර ඇති පරිදි රු. 676,343.05 කි.**

සමාගමේ අධ්‍යක්ෂවරු

**2017 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා සමාගමේ අධ්‍යක්ෂවරු පහත දැක්වෙන පරිදි වේ.**

**පී.එස්. සමරකෝන් මයා - සභාපති**
**ඩබ්ලිව්. ඒ. ඉන්ද්‍රානි සුගතදාස මිය**
**එච්.එච්. කස්තුරිආරච්චි මයා**
**පී. රාසයියා මයා**
**ටී.පී. රත්නායක මයා**
**එම්.ඒ.එල්.එස්.එන්.කේ. මන්ත්‍රීනායක මයා**
**එම්.ඒ.එස්.පී. පළිහවඩන මයා**
**ඒ.යූ.සී. අතුකෝරාළ මයා**
**ඩී.අඹේවෙල මයා**
**ජී.නල්ලපෙරුම මයා**
**කේ. බ්‍රාහ්මණ මයා**

විගණන ගාස්තු

**සමාලෝචිත මූල්‍ය වර්ෂය සඳහා විගණන ගාස්තුව ගෙවා නොමැත.**

විගණකවරු ලෙස හැර විගණකවරුන් සමාගම සමග ඇති බැඳියා

**තම ස්වාධීන්තවයට හානි වන කිසිදු සබඳතාවක් හෝ බැඳියාවක් විගණකවරුන් සමාගම කෙරෙහි නොමැති බවට අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ.**

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| **පී.එස්. සමරකෝන්** | **එම්.ඒ.එල්.එස්.එන්.කේ. මන්ත්‍රීනායක** | **ලේකම්වරු** |
| **සභාපති** | **අධ්‍යක්ෂ** | **කෝපරේට් සර්විස් (පුද්) සමාගම** |

**2017 සැප්තැම්බර් මස 6 වන දිනදීය.**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } PLA/B/KTF/01/16/17/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } November 2017

The Chairman

Kalubovitiyana Tea Factory Limited.

**Report of the Auditor General on the Financial Statements of the Kalubovitiyana Tea Factory Limited for the year ended 31 March 2017 in terms of Article 154 (6) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.**

---

The Above mentioned report is sent herewith for your reference please.

Please note that this report will be tabled at the parliament.

S.T.B.Rathnayake,

Assistant Auditor General,

For Auditor General.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම.

---

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තිරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ

සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 සමාගම පිහිටුවීම හා සමාගමේ අයිතිය

--------------------------------------

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද වගකීමෙන් සීමිත සමාගමක් වන අතර 2007 අංක 07 දරන පනත යටතේ යළි ලියාපදිංචි කර තිබුණි. අයිතිය සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන මෙම සමාගමේ තනි කොටස් හිමිකරු වන්නේ භාණ්ඩාගාර ලේකම්වරයාය.

1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

---

කල්පිරීම වසරක් ඉක්මවන ආයෝජන ජංගම නොවන වත්කම් යටතේ නිරූපණය කළ යුතු වුවත්, 2018 ජුනි 07 දින කල්පිරීමට නියමිත රු.94,360,820 ක් වටිනා ස්ථාවර තැන්පතු 02ක් ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

---

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.222,170,063 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

---

(i) ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව සේවක ප්‍රතිලාභ වගකීම මැනීම සඳහා ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය යොදා ගත යුතු වුවද සමාගම විසින් පාරිතෝෂික සූත්‍ර ක්‍රමය යොදාගෙන මැනීම සිදුකර තිබුණි.

(ii) ප්‍රමිතයේ 57 (ඇ) ඡේදය ප්‍රකාරව ශුද්ධ සේවක ප්‍රතිලාභ වගකීම (වත්කම්) නැවත අගය කිරීමේදී හඳුනා ගනු ලබන ආයු ගණක ලාභය හෝ අලාභය වෙනත් විස්තීරණ ආදායම් යටතේ දැක්විය යුතු වුවද රු.691,779 ක් වූ ආයු ගණක අලාභ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012/2013 වර්ෂයේ බදු පදනම මත ලබාගත් හිනිදුම හීල්ස් තේ කර්මාන්තශාලාවේ තීන්ත ආලේපන හා ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා දරන ලද එකතුව රු.6,194,940 ක් වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස රු.1,238,988 ක් ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

(ආ) දැරංගල තේ කර්මාන්තශාලාවට අයත් තේ වියලුම් යන්ත්‍රයක් ඉකුත් වර්ෂයේදී අපහරණය කර තිබුණු අතර එම යන්ත්‍රයේ පිරිවැය ගිණුම්වලින් ඉවත්කිරීමට හා ඒ තුලින් ඇති වූ ලාභය/පාඩුව ගණනය කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. ඒ සඳහා ඉකුත් වර්ෂයේදී ලැබුණු රු.1,000,000 ක් වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 අවිනිශ්චිත ගිණුම්

වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ සහ ණයහිමියෝ හා උපචිත වියදම් යටතේ දක්වා ඇති වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන අවිනිශ්චිත ගිණුම් ශේෂවල පිළිවෙලින් රු.221,750 ක හා රු. 468,287 ක ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්තමානයේ ක්‍රියාත්මක නොවන සේද හා ආශ්‍රිත නිෂ්පාදන අධිකාරියෙන් ලැබිය යුතු රු.451,547 ක ණයගැති ශේෂයක් සමාගමේ ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමට අයත් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ රු.4,645,499 ක් වූ ලැබිය යුතු ශේෂයෙන් රු.1,374,152 ක් හෙවත් සියයට 30 ක් හා දැරංගල තේ කර්මාන්තශාලාවේ රු.4,861,918 ක ලැබිය

යුතු ශේෂයෙන් රු.1,712,313ක් හෙවත් සියයට 35 ක් වර්ෂ 5 ඉක්මවා තිබුණ ද ඒවා අයකර ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ රු.40,838,277 ක් වූ ගෙවිය යුතු ණය ශේෂයෙන් රු.1,206,655 ක් හා දැරංගල කර්මාන්තශාලාවේ එදිනට වූ රු.19,106,476 ක ගෙවිය යුතු ශේෂයෙන් රු.274,211 ක් වර්ෂ 05 ඉක්මවා තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනත | |
| (i) 131(1) වගන්තිය | වාර්ෂික මහාසභා රැස්වීම පවත්වා වැඩකරන දින 30 ක් ඇතුළත වාර්ෂික වාර්තාව (ආකෘති පත්‍ර 15) සමාගමේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර සහතික කළ යුතු වුවත් 2015/2016 වර්ෂය සඳහා එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) 133 වගන්තිය | ශේෂ පත්‍ර දිනෙන් මාස 6 ක් හා ඊට පෙර පවත්වන ලද වාර්ෂික මහාසභා රැස්වීමට මාස 15 නොඉක්මවන කාලයක් තුළදී වාර්ෂික මහාසභා රැස්වීම පැවැත් විය යුතු වුවද 2011/2012 වර්ෂයෙන් පසුව අවසන් මහාසභා රැස්වීමක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත 200 වගන්තිය | පනතේ විධිවිධානවලට පටහැනිව ඉකුත් වර්ෂයේ ස්වතක්සේරුව මත වැඩිපුර ගෙවන ලද රු.1,676,203 ක ආදායම් බදු |

| | | |
|---|---|---|
| | | සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ ආදායම් බදු බැඳියාව ගණනය කිරීමේදී අධිගෙවීමක් සේ සළකා අඩුකර තිබුණි. |
| (ඇ) | 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල (සංශෝධන) පනත 9(2) වගන්තිය | සමාගම වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී මූලික වැටුපට ජීවන වියදම් දීමනාව එකතුකර ඒ මත දායකය ගණනය කලයුතු වුවත් එසේ කටයුතු නොකිරීම නිසා 2017 මාර්තු 31 දිනට රු. 391,248 ක් අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (2006) 2.7.5 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණ ඇගයීම් කමිටු, ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර පත් කළ යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබූ අවස්ථා පැවතුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව කිසිදු විටක ලංසු කරුවන් සමඟ සබඳතා සාකච්ඡා නොපැවත්විය යුතු නමුත් සමාගම විසින් ලොරි රථය සඳහා කන්ටේනර් ටැංකියක් සවිකිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.29,501,008 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,815,528 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,685,480 ක එනම් සියයට 200 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. විකුණුම් පිරිවැය රු.114,258,649 කින් වැඩි වී වෙනත් මෙහෙයුම් ආදායම රු.23,913,277 කින් අඩු වුවද විකුණුම් ආදායම රු.159,861,684 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012/2013 වර්ෂයේදී රු.21,794,010 ක අතිරික්තය 2015/2016 වර්ෂය දක්වා අඛණ්ඩව අඩු වී තිබුණු අතර 2015/2016 වර්ෂයට සාපේක්ෂව 2016/2017 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය සියයට 188 කින් වර්ධනය වී තිබුණි. කෙසේ වුවද අතිරික්තයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රජයට ගෙවන ලද බදු නැවත ගැලපීමේදී සමාගමේ 2012/2013 වර්ෂයේදී රු.81,785,215 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2016/2017 වර්ෂයේදී රු.134,903,337 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 5.76 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය සියයට 1.079 ක් විය. සමාලෝචිත වර්ෂයේ අවසන් තොගය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 55 කින් වැඩිවීම මෙයට ප්‍රධාන ලෙස හේතුවී තිබුණි.

### 3.3 සමාගමට එරෙහිව හෝ සමාගම විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ සේවකයන් දෙදෙනෙකු විසින් සේවයෙන් පහකිරීම සම්බන්ධයෙන් සමාගමට එරෙහිව කොටපල කම්කරු උසාවියේ 2007 වර්ෂයේදී ගොනුකර තිබූ නඩුවක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විභාග වෙමින් පැවතුණි.

(ආ) 2010/2011 වර්ෂයේ සමාගම විසින් ආදායම් බදු ගෙවීමේ පදනම නිවැරදි බවට බදු අභියාචන කොමිසම මගින් ලබා දෙන ලද තීන්දුවට එරෙහිව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අභියාචනාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස 2009 ජුනි 16 දින අංක. පි බි 1020 යටතේ සංස්ථාපනය කරන ලද කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම යටතේ කළුබෝවිටියාන, දැරංගල, හිනිදුම හා මැණික්දිවල යන තේ කර්මාන්ත ශාලා

ක්‍රියාත්මක වන අතර එම කර්මාන්තශාලාවන්හි කාර්ය සාධනය පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි විය.

(අ) තේ නිෂ්පාදනය

----------------

තේ මණ්ඩලයේ නිර්ණායක අනුව යෙදවූ අමු තේ දළු කිලෝ ග්‍රෑම් 100 කින් අවම වශයෙන් නිමි තේ කිලෝ ග්‍රෑම් 21.5 ක නිෂ්පාදන මට්ටමක් පවත්වාගත යුතු නමුත් සමාගම විසින් විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුල තේ කම්හල් 04 හි සිය නිෂ්පාදනයෙහි නිමවුම් ප්‍රතිශතය ප්‍රශස්ත මට්ටමට පවත්වාගෙන යාමට අපොහොසත් වී තිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අමු තේ දළු මත රු. 28,818,983 ක සමුච්චිත අලාභයක් දරා තිබූ අතර ගුණාත්මක බවින් ඉහළ අමු තේ දළු මිලදී ගැනීමට නොහැකි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) නිෂ්පාදන පිරිවැය හා ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිල

----------------------------------------------------

සමාගම විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පසුගිය වසර 03 ක කාලච්ඡේදය තුල සමාගමේ කර්මාන්තශාලා 04 න් හිනිදූම හා මැණික්දිවෙල කර්මාන්තශාලා 02හි ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිලට වඩා තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය වැඩි වී තිබුණි. එම නිසා තේ කිලෝවක දායකය අවාසි සහගත වූ බැවින් එම කම්හල් අඛණ්ඩව අලාභ ලබා තිබුණි. අපේක්ෂිත තේ දළු ප්‍රමාණය මිලදී ගැනීමට නොහැකි වීම මත තේ කිලෝවක අන්තර්ගත ස්ථාවර පිරිවැය ඉහළ යාමද, ශ්‍රම ඵලදායීතාවය පහළ මට්ටමක පැවතීමද තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතු වී තිබුණි.

(ඇ) ධාරිතා උපයෝජනය/ ඉලක්ක ගත තේ නිෂ්පාදනය

-------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම අනුව එක් එක් කර්මාන්තශාලාවන් වෙනුවෙන් තේ නිෂ්පාදනය සඳහා ඉලක්කයන් ඇතුලත් කර නොතිබුණු අතර සමාගමේ අයවැය ලේඛනය අනුව කම්හල්වල ඉලක්කගත හා තථ්‍ය තේ නිෂ්පාදනය සහ යන්ත්‍ර උපයෝජනය පහත පරිදි වේ.

| කම්හල | අයවැය අනුව ඉලක්කගත තේ නිෂ්පාදනය | තථ්‍ය තේ නිෂ්පාදනය | විචලනය ප්‍රතිශතය වාසි/(අවාසි) | නිෂ්පාදන ධාරිතාව | ඌන උපයෝජන ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | කි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | | කි.ග්‍රෑ. | |
| කළුබෝවිටියාන | 1,100,000 | 811,708 | (26) | 1,350,000 | 39.87 |
| දැරංගල | 425,055 | 429,382 | 1 | 485,000 | 11.47 |
| හිනිදුම | 325,000 | 253,157 | (22) | 485,000 | 47.80 |
| මැණික්දිවෙල | 414,209 | 209,464 | (49) | 450,000 | 53.45 |

සමාලෝචිත වර්ෂයේ සියළුම කම්හල් ඌන ධාරිතාවයකින් ක්‍රියාකර තිබූ අතර දැරංගල කර්මාන්ත ශාලාවේ ඉලක්කගත තේ නිෂ්පාදනයක් ලගාකර තිබුණද පසුගිය වර්ෂයේ එම කර්මාන්ත ශාලාවේ ඉලක්කගත තේ නිෂ්පාදනය හා තථ්‍ය තේ නිෂ්පාදනය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 542,042 ක් හා කිලෝ ග්‍රෑම් 460,860 ක් වූයෙන් එම වර්ෂයට සාපේක්ෂව ඉලක්කගත තේ නිෂ්පාදනයෙහි හා තථ්‍ය තේ නිෂ්පාදනයෙහි සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය.

(ඈ) තේ පැල තවාන් ආරම්භ කිරීම

නියමිත ප්‍රමිතියෙන් යුත් තේ පැල සැපයීමේ අරමුණින් පසුගිය වර්ෂයේදී රු.1,201,075 ක් වැය කර දැරංගල තේ කර්මාන්තශාලාවට අනුබද්ධව තේ පැල තවානක් ආරම්භ කර තිබුණි. මෙම වාණිජ රිකිළි තේ පැල තවානේ ධාරිතාවය පැල 100,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේ තවානේ පැවති මුළු පැල සංඛ්‍යාව 51,485ක් වූයෙන්, එය මුළු ධාරිතාවයෙන් සියයට 51 ක් පමණක් විය.

## 4.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශයට අනුකූලව රු.500,000 ක් දක්වා පමණක් සෘජු මිලදී ගැනීම සඳහා බලය පැවරිය හැකි වුවත් ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සභාපති වෙත රු.1,000,000 ක් දක්වා මිලදී ගැනීම් සඳහා බලය පවරා තිබුණි.

(ආ) කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට අයත් කර්මාන්තශාලා මඟින් තේ දළු සැපයුම්කරුවන් වෙත ලබාදීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී පොහොර මිලදී ගැනීම සඳහා රු.38,917,405 ක් වැයකර තිබුණි.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තේ ශක්ති අරමුදලට අයත් හිනිදුම තේ ශක්ති තේ කර්මාන්තශාලාව හා ඉදිවෙමින් පැවති යටිනුවර තේ කර්මාන්තශාලාව වසර 30 ක දීර්ඝකාලීන බදු පදනම මත සමාගම වෙත ලබාගැනීම සඳහා 2015 අප්‍රේල් 09 වන දින රු.50,000,000 ක බදු මුදල් ගෙවා තිබුණද 2017 අගෝස්තු 09 දින දක්වාම දෙපාර්ශවය විසින් විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවේ නිෂ්පාදිත තේවල ගුණාත්මක බව වර්ධනය කර ඉහල මිලක් ලබා ගැනීම සඳහා රු.1,807,196 ක් වැයකර වර්ණ විභේදන (Colour Separator) යන්ත්‍රයක් මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ ලබාගෙන භාවිතා කර තිබුණි. ඒ අනුව තේවල ගුණත්වය තවදුරටත් වර්ධනය කර ඉහළ විකුණුම් මිලක් ලබාගත යුතු වුවද එසේ ඉහල මිලක් ලැබී නොතිබුණි.

(ඇ) කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ තේ වියලන යන්ත්‍ර අළුත්වැඩියාව වෙනුවෙන් 2012 වර්ෂයේදී රු.7,380,537 ක අත්තිකාරම් ලබාදී තිබුණි. සේවා සැපයුම්කරු විසින් ඉටුකරන ලද එම අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණ වාර්තාවක් ලබාගෙන නොතිබුණු අතර අත්තිකාරම් නිරවුල් කිරීමට ද කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ප්‍රධාන කාර්යාලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 26 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 28 ක් විය. ඉන් තිදෙනෙක් කොන්ත්‍රාත් පදනම

මත බඳවාගෙන තිබුණි. කර්මාන්තශාලා සඳහා කාර්ය මණ්ඩලය 100 ක් අනුමත කර තිබූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 61 ක් විය. ඉන් හතර දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ආ) මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවේ සහකාර කම්හල් නිලධාරි තනතුර හා කළමනාකරු තනතුර සඳහා අනුමත බඳවාගැනීම් පරිපාටියට අනුකූලව අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් නොමැති නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර ඒ සඳහා අමාත්‍යාංශ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

### 5.1 නොවිසඳී ඇති විගණන ඡේද

-----------------------------

2013 පෙබරවාරි 27 දින පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී පහත සඳහන් ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා නියෝග ලබාදී තිබුණි.

(අ) 2003 වර්ෂයේදී වාරික 12 කින් අයකර ගැනීමේ පදනම මත පෞද්ගලික සමාගමකට සියයට 22 ක පොලී අනුපාතයක් යටතේ රු.10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු නමුත් එක් වාරිකයක් හෝ අයකරගැනීමට නොහැකිවී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු මුළු මුදල රු.47,438,780 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) 2009 වර්ෂයේ තැරැව්කාර සමාගමකින් ලැබිය යුතු රු.789,461 ක් වූ මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය නොවී පැවතුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන පාලනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවීම. |
| (ආ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ | දීර්ඝ කාලීනව අයකර ගැනීමට හා නිරවුල් නොකර පවතින ශේෂ පැවතීම. |
| (ඇ) | මුල්‍ය පාලනය | බැංකු අයිරාව මත විශාල පොලී මුදලක් ගෙවීම. |
| (ඈ) | කර්මාන්තශාලා මෙහෙයුම් පාලනය | කර්මාන්තශාලා විසින් අලාභ ලැබීම් අවම කරගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකිරීම හා බදු පදනම මත ලබාගත් දේපල සඳහා බදු ගිවිසුම් නොපැවතීම. |

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**
**ලාභ හෝ පාඩු සහ අනෙකුත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශය**
**2017 මාර්තු 31 අවසන් වසර සඳහා**
*(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)*

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| ආදායම | **03** | **935,591,884.34** | 775,730,199.81 |
| විකුණුම් පිරිවැය | **04** | **(881,617,227.76)** | (767,358,578.70) |
| **දළ ලාභය** | | **53,974,656.58** | **8,371,621.11** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | **05** | **7,557,839.19** | 31,471,116.31 |
| **මෙහෙයුම් වියදම් වලට පෙර ලාභය** | | **61,532,495.77** | **39,842,737.42** |
| පරිපාලන වියදම් | **06** | **(32,446,062.42)** | (30,507,913.27) |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | **07** | **(816,516.79)** | (905,666.27) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ** | | **28,269,916.56** | **8,429,157.88** |
| මූල්‍ය ආදායම් | **08.1** | **12,118,516.91** | 11,994,059.80 |
| මූල්‍ය වියදම් | **08.2** | **(9,164,033.62)** | (8,428,981.00) |
| ශුද්ධ මූල්‍ය ආදායම | | **2,954,483.29** | 3,565,078.80 |
| **බදුකරණයට පෙර ශුද්ධ ලාභය** | | **31,224,399.85** | **11,994,236.68** |
| බදුකරණය | **09** | **(1,723,391.30)** | (2,178,708.56) |
| **බදු අයකිරීමෙන් පසු ශුද්ධ ලාභය** | | **29,501,008.55** | **9,815,528.12** |
| **කොටසක් සඳහා ඉපැයුම්** | **10.1** | **6.36** | **2.12** |

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**
**මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව**
**2017 මාර්තු 31 දිනට**

| *(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)* | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ,පිරියත සහ උපකරණ | **11** | **216,541,929.33** | 232,394,679.45 |
| ජීව විද්‍යාත්මක වත්කම් | **12** | **3,083,458.74** | 2,981,298.74 |
| | | **219,625,388.07** | **235,375,978.19** |
| **ජංගම වත්කම්** | | | |
| වට්ටෝරු භාණ්ඩ | **13** | **133,380,209.23** | 92,385,495.72 |
| බීසීසී ලංකා සමාගමෙන් අයවිය යුතු මුදල් | | **47,438,779.75** | 44,702,867.29 |
| මූල්‍ය වත්කම් | **14** | **165,849,052.91** | 157,886,840.52 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | **15** | **62,343,894.88** | 49,907,231.12 |
| දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් | **25** | **1,384,543.37** | 533,258.32 |
| මුදල් සහ මුදලට සමාන දේ | **16** | **4,874,960.61** | 3,751,241.37 |
| **එකතුව** | | **415,271,440.75** | 349,166,934.34 |
| **මුළු වත්කම්** | | **634,896,829.09** | **584,542,912.80** |
| **සම කොටස් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | **17** | **46,375,070.00** | 46,375,070.00 |
| සංචිත | **18** | **418,952,204.77** | 389,451,196.22 |
| **එකතුව** | | **465,327,274.77** | **435,826,266.22** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | **19** | **12,971,187.81** | 10,897,999.45 |
| බැංකු ණය - මහජන බැංකුව | **20** | **30,937,500.07** | - |
| **එකතුව** | | **43,908,687.88** | **10,897,999.45** |
| **ජංගම වගකීම්** | | | |
| ණය හිමියන් සහ උපචිත ගාස්තු | **21** | **89,283,786.21** | 69,157,898.63 |
| බැංකු අයිරා | **22** | **17,535,366.13** | 63,067,583.65 |
| බැංකු ණය | **23** | **13,749,999.96** | - |
| විලම්බිත බදු වගකීම්/ (වත්කම්) | **24** | **5,091,714.15** | 5,593,164.85 |
| **එකතුව** | | **125,660,866.45** | **137,818,647.13** |
| **මුළු සම කොටස් හා වගකීම්** | | **634,896,829.10** | **584,542,912.80** |

මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත්තේ 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතා ප්‍රකාරව බව අපි සහතික කරමු.

.................................
මූල්‍ය කළමණාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

.............................
**අධ්‍යක්ෂ**

.............................
අධ්‍යක්ෂ

2017 අගෝස්තු 29 දින
කොළඹදීය

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**

**ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය**

**2017 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා**

*(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)*

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය (සටහන 17) | මහ භාණ්ඩාගාරය | ප්‍රාග්ධන සංචිත | රඳවාගත් ලාභය | එකතුව |
|---|---|---|---|---|---|
| 2015 අප්‍රේල් 01 දිනට ශේෂය | **46,375,070.00** | **23,229,000.00** | **600,000.00** | **379,035,668.10** | **449,239,738.10** |
| වසර සඳහා ශුද්ධ ලාභය | - | - | - | 9,815,528.12 | 9,815,528.12 |
| නිවැරදි කිරීම | | (23,229,000.00) | | | (23,229,000.00) |
| 2016 අප්‍රේල් 01 දිනට ශේෂය | **46,375,070.00** | **-** | **600,000.00** | **388,851,196.22** | **435,826,266.22** |
| වසර සඳහා ශුද්ධ ලාභය | - | - | - | 29,501,008.55 | 29,501,008.55 |
| | | | | | - |
| **2017 මාර්තු 31 දිනට ශේෂය** | **46,375,070.00** | **-** | **600,000.00** | **418,352,204.77** | **465,327,274.77** |

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම

2017 මාර්තු 31න් අවසන් වසර සඳහා

| මුදල් ප්‍රවාහ ප්‍රකාශය<br>*(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)* | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු අයකිරීමට පෙර ශුද්ධ ලාභය | | **31,224,399.85** | 11,994,236.68 |
| | | | |
| **ගැලපුම්:** | | | |
| ක්ෂයවීම් | | **27,076,927.96** | 25,540,763.71 |
| විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය සඳහා වෙන්කිරීම් | | **3,089,158.36** | 2,091,639.45 |
| වත්කම් බැහැර කිරීම් මත ලාභය | | **-** | (1,950,000.00) |
| පොළී ආදායම් | | **(12,118,516.91)** | (11,994,059.80) |
| මහ භාණ්ඩාගාර ප්‍රදානය නිවැරදි කිරීම | | | (23,229,000.00) |
| **කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් ලාභය/පාඩුව** | | **49,271,969.26** | **2,453,580.04** |
| | | | |
| භාණ්ඩ ලේඛන (වැඩිවීම්)/අඩුවීම් | | **(40,994,713.51)** | (7,472,536.47) |
| වෙළඳ සහ අනෙකුත් අයවිය යුතු (වැඩිවීම්)/අඩුවීම් | | **(12,436,663.76)** | 19,213,377.73 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු (වැඩිවීම්)/අඩුවීම් | | **20,125,887.58** | 15,193,466.22 |
| **මෙහෙයුම්වලින් ලත් ආදායම** | | **15,966,479.57** | 29,387,887.52 |
| | | | |
| ගෙවන ලද පාරිතෝෂික | | **(1,015,970.00)** | (311,500.00) |
| ගෙවූ බදු | | **(3,076,127.05)** | (1,751,841.13) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ලාභය/ (භාවිතා කළ)** | | **11,874,382.52** | **27,324,546.39** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම | | **(11,326,338.41)** | (89,741,662.69) |
| දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම | | | 1,950,000.00 |
| ලැබුණු පොළිය | | **9,382,604.45** | 9,258,147.34 |
| බැංකු ණය | | **44,687,500.03** | - |
| මූල්‍ය වත්කම්වල ශුද්ධ වෙනස්කම් | | **(7,962,212.39)** | (20,378,270.62) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්** | | **34,781,553.68** | **(98,911,785.97)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/(භාවිතා කළ)** | | | |
| | | **-** | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ /(භාවිතා කළ)** | | **-** | - |
| | | | |
| **මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | | **46,655,936.20** | (71,587,239.58) |
| | | | |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දේ | | **(59,316,341.72)** | 12,270,899.18 |
| **වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දේ** | **16** | **(12,660,405.52)** | **(59,316,341.72)** |

1. වාර්තාකරණ අස්තිත්වය

1.1 සංස්ථාමය තොරතුරු

සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් 30 දින සංස්ථාගත කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2009 ජූනි 16 වන දින යළි ලියාපදිංචි කරන ලද ඇපයෙන් සීමිත වූ, ශ්‍රී ලංකාව නිත්‍ය වාසස්ථානය වන සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 556, නාගහමුල්ල, පැලවත්ත, තලංගම දකුණ යන ලිපිනයෙහි පිහිටා තිබේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය
සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ තේ වගාකිරීම සහ නිෂ්පාදනය සහ තේ වගාකරුවන්ගෙන් සහ තමන්ටම අයත් වතුයායයලින් මිලදී ගත් තේ අලෙවි කිරීමයි.

1.3.1 අධ්‍යක්ෂවරු

2017 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය මේ සමගින් ඉදිරිපත් කරයි. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
2017 මාර්තු 31 දිනට සමාගමේ අධ්‍යක්ෂවරුන් පහත දැක්වෙන පරිදි වේ.

පී.එස් . සමරකෝන් මයා
එම්.ඒ.එස්.පී. පළිහවඩන මයා
අයි.සුගතදාස මිය
ඒ.යූ.සී. අතුකෝරාළ මයා
කේ.බ්‍රාහ්මණ මයා
හේමාල් කස්තුරිආරච්චි මයා
එම්.ඒ.එල්.එච්.එන්.කේ. මන්ත්‍රීනායක මයා
ගාමිණී නල්ලපෙරුම මයා
පී.රාසයියා මයා
තුසිත රත්නායක මයා
ඩී. අබේවෙල මයා

1.4 සමාගමේ ලේකම්වරු
කෝපරේට් සරවිසස් (පුද්ගලික) සමාගම
216, ද සේරම් පෙදෙස,
කොළඹ 05

1.5.1 ලියාපදිංචි කාර්යාලය
අංක 556, නාගහමුල්ල,
පැලවත්ත, තලංගම දකුණ

1.6 විගණකවරු
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල

1.7 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරිම සඳහා බලය පැවරූ දිනය
මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 මැයි 31 දින බලය පවරන ලදී.

## 2. සාමාන්‍ය ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සී / ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ මූල්‍ය ප්‍රකාශන; මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහාවූ සටහන්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවය.

### 2.2 මැණීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකමට අදාළව යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදුකර ඇති අවස්ථාවන්හි හැර මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමිනි. වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව සහ සාපේක්ෂ ද්‍රවශීලතාව පිළිබිඹු කරන ආකාරයෙන් කණ්ඩායම් කර ඇත. මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී වැදගත් ඇස්තමේන්තු ක්ෂෙත්‍ර, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල ඇතුලත් කර තිබේ.

### 2.3 බදුකරණය

(අ) ප්‍රවර්තන බදු

මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි තදනන්තර සංශෝධනයන්හි විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇත.

(ආ) විලම්බිත බදු

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත බදු සපයනු ලැබ ඇත්තේ, මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සහ බදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයන් සඳහා වත්කම් සහ බැරකම් අතර ධාරණ ප්‍රමාණවල තාවකාලික වෙනස්කම්වලට විධිවිධාන සලස්වමිනි. විලම්බිත බදු මනිනු ලබන්නේ වාර්තාකරණ දිනය වන විට පනවා ඇති නීති මත පදනම්ව, තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්තනය කළ විට ඒවාට ආදේශ කිරීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයටය.

විලම්හිත බදු වත්කම් පිළිගනු ලබනුයේ එම කාල අන්තරවලට සාපේක්ෂව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි අනාගත බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාවක් ඇති ප්‍රමාණයටය. එක් එක් වාර්තාකරණ දිනයේදී විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමේ ඉඩක් තවදුරටත් නොමැතිවීමේ ප්‍රමාණයට අඩුකරනු ලැබේ.

## 2.4 වත්කම් තක්සේරුව සහ ඒවා මැනීමේ පදනම්

### 2.4.1 දේපල, පිරියත සහ උපකරණ

දේපල ,පිරියත හා උපකරණ සඳහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමේ කිසියම් හානියක් වේ නම් එය අඩු කර සාධාරණ අගයටය. සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස්වීම් මගින් ධාරණ වටිනාකම යළි අය කර ගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී, දේපල, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම හානිවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියලු දේපල, පිරියත හා උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ ඒවායේ පිරිවැය මත ය. දේපල, පිරියත හා උපකරණ තදනන්තරව ප්‍රතිප්‍රමාණ කර ඇති අවස්ථාවන්හිදී එබඳු වත්කම්වල සමස්ත කාණ්ඩයම සාධාරණ අගය මත ප්‍රතිප්‍රමාණ කරනු ලැබේ. මෙම ප්‍රතිප්‍රමාණ කිරීම ප්‍රමාණවත් නිත්‍යතාවකින් සිදු කරනු ලැබේ. යම් දේපලක් ප්‍රතිප්‍රමාණ කළ අවස්ථාවක එහි ධාරණ වටිනාකම වැඩිවීමත් සිදුවී ඇති අවස්ථාවක පෙර ආදායම් ප්‍රකාශවල සඳහන් වී ඇති එකී දේපල අවමවීමක් ලෙස සටහන් වූ අවස්ථාවකදී හැර එය ප්‍රතිවටිනාකම් සංචිතයට ඍජු ලෙස බැර කරනු ලබන අතර එවන් අවස්ථාවකදී වැඩිවීමම අදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ. එකම වත්කමෙහි පෙර අතිරික්තයක් හිලව් කරන්නා වූ යම් ප්‍රත්‍යාගණන හිඟයක්, ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තයට ඍජුවම හිලව් කරන අතර යම් අතිරික්තයක් වේ නම් එය වියදමක් ලෙස පිලිගනු ලැබේ.

බැහැර කිරීමේදී විකුණනු ලැබූ වත්කමට අදාළ කිසියම් ප්‍රතිප්‍රමාණ සංචිතයක් වේ නම් එය රඳවාගත් ඉපැයුම්වලට පවරනු ලැබේ. යම් දේපල, පිරියත හෝ උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කිරීමේදී හෝ බැහැර කිරීමේදී හෝ ඒවායේ භාවිතය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම් ඒවා ඉවත් කරනු ලැබූ සේ සැලකේ. එසේ වත්කම් ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන කිසියම් ලාභයක් හෝ පාඩුවක් එලෙස ඉවත් කිරීම සිදු කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට ඇතුළු කරනු ලැබේ.

### (අ) ක්ෂයවීම

පිරිවැය මත සරල රේඛීය ක්‍රමය භාවිතා කිරීම මගින් හෝ සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලු දේපල, පිරියත සහ උපකරණ තක්සේරු කිරීම මගින් එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ එම ප්‍රමාණ පොත් වලින් ඉවත් කිරීම පිණිස, ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | අවුරුදු |
|---|---|
| ගොඩනැගිලි | 20 |
| පින්තාරුකිරීම් | 5 |
| ජලය හා විදුලිය | 20 |
| මෝටර් රථ වාහන | 4 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 8 |
| උපකරණ | 8 |
| ලීබඩු සහ සවිකිරීම් | 8 |
| පරිගණක මෘදුකාංග | 8 |
| මාර්ග | 10 |
| වෙනත් | 8 |

සින්නක්කර ඉඩම් සඳහා අසීමිත ආයු කාලයක් ඇතැයි සලකන බැවින් ඒවා ක්ෂය කරනු නොලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම, උචිත නම් වත්කමේ අවශිෂ්ඨ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂයකිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කොට ගලපනු ලැබේ.

(ආ) ප්‍රතිසංස්කරණ පිරිවැය

මුලින්ම තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රකෘතිමත් කිරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දැරූ වැය, එලෙස දැරූ විටදී වියමදක් ලෙස පිළිගනු ලැබේ.

2.4.2 ජීවවිද්‍යාත්මක වත්කම්

සමාගම ජීවවිද්‍යාත්මක වත්කම් පිළිගනු ලබන්නේ අතීත සිදුවීම්හි ප්‍රතිඵලයක් ලෙස සමාගම වත්කම පාලනය කරන විටදී, වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ හැකියාවක් ඇති විටදී සහ වත්කමේ සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකි විටකදීම පමණි. ජීවවිද්‍යාත්මක වත්කම් සඳහා හානිවීම් ගණනය කරනු නොලැබේ.

2.4.3 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

සමාගම මුලින්ම ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා උත්පාදනය කරනු ලැබූ දිනයට පිළිගනු ලබයි. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට නිශ්චය කරනු ලැබූ වත්කම් ඇතුළුව) සාධන පත්‍රයේ ගිවිසුම්කර ප්‍රතිපාදනයන්ට සමාගම පාර්ශවයක් වූ වෙළඳ දිනයට මුලින්ම පිළිගනු ලැබේ.

මුදල් ප්‍රවාහය වෙත වත්කමෙහි ගිවිසුම්කර හිමිකම් අවසන් වන විටදී හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පවරනු ලබන ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතින් එය පවරන විටදී සමාගම මූල්‍ය වත්කමක පිළිගැනීම ඉවත් කරයි. සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳාවාගනු ලබන, පවරනු ලැබූ මූල්‍ය වත්කම්වල කවර හෝ බැඳීමක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලබයි.

සමාගමට විටිනාකම් හිලව් කිරීමට නෛතික හිමිකමක් ඇතිවිටදී හෝ වත්කම ශුද්ධ පදනමක් මත පියවා හෝ උපලබ්ධි කර සමගාමීව බැරකම පියවීමට අදහස් කරන විටකදී පමණක්ම මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර වත්කම ශුද්ධ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

සමාගම සතුව පහත දැක්වෙන මූල්‍ය වත්කම් තිබේ. ( ව්‍යුත්පන්න නොවන)

- ණය හා ලැබිය යුතු දේ
- මුදල් හා මුදලට සමාන දේ

(ආ) ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. එබඳු වත්කම් මුලින්ම සාධාරණ අගය සහ ඍජුව ආරෝපණය කළ හැකි කිසියම් ගනුදෙනු පිරිවැයකට පිළිගනු ලැබේ. මූලික පිළිගැනීමට තදනන්තරව, ණය හා ලැබිය යුතු දෑ ගණනය කරනු ලබන්නේ යම් හානිකරණ අලාභ අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයටය. ණය සහ ලැබිය යුතු දෑ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෙයින් සමන්විත වේ.

(ඇ) මුදල් හා මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයන්හි, මුදල් හා මුදලට සමාන දෑ මුදල් ශේෂ හා මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ. ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි සහ සමාගමේ මුදල් කළමනාකරණයේ අනුකලන කොටසක් වන්නාවූ බැංකු අයිරා මුදල් හා මුදලට සමාන දේවල සංරචකයක් ලෙස මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා අන්තර්ගත කොට ඇත. මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් හා බැංකුවේ තැන්පතුවලින් සමන්විත වේ. වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් සකස් කොට ඇති මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා මුදල් හා මුදලට සමාන දෑ සංරචකයක් ලෙස බැංකු අයිරා අන්තර්ගත කොට ඇත.

### 2.4.4 හානි

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් දරනු නොලබන මූල්‍ය වත්කමක්, එය හානිවූ බවට වාස්තවික සාක්ෂි තිබේදැයි නිර්ණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ඇත. වත්කමේ මූලික පිළිගැනීමෙන් පසු අලාභ සිදුවීමක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ විශ්වාසනීය ලෙස මිණිය හැකි එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට නිශේධනීය බලපෑමක් එම අලාභ සිදුවීම ඇති කළේ නම් මූල්‍ය වත්කමක් හානිවී ඇත.

ලැබිය හැකි දේ සඳහා හානි පිළිබඳ සාක්ෂි සමාගම සාමූහික මට්ටමේදී සලකා බලයි. සමාන අවදානම් ගතිලක්ෂණ සහිත ලැබිය හැකි සියලු දේ එකට කාණ්ඩ කරන අතර සිදුව ඇති එහෙත් මෙතෙක් හඳුනාගෙන නොමැති කිසියම් හානියක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ඇත.

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කමකට අදාළ හානි අලාභයක් එහි ධාරණ වටිනාකම හා වත්කමේ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ. අලාභවීම් ලාබ හෝ පාඩුවල පිළිගනු ලබන අතර ලැබීම්වලට සාපේක්ෂව දීමනා ගිණුමක පෙන්නුම් කරනු ලැබේ. හානිවූ වත්කමක් මත පොළිය, වට්ටම අනාගතයට ගැලපීම හරහා අඛණ්ඩව පිළිගනු ලැබේ. පසුව ඇතිවන සිදුවීමක් හානි අලාභ වටිනාකම අඩුකිරීමට හේතුවන්නේ නම්, ලාබ හෝ පාඩු හරහා හානි අලාභයේ අඩුවීම ප්‍රතිවර්තනය කරනු ලැබේ.

**2.4.5** වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිසකසන ලද, පිරිනොසකසන ලද හා අර්ධ පිරිසකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන සහ අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍යයන්ගෙන් සමන්විත වේ. පිරිසකසන ලද, පිරිනොසකසනලද හා අර්ධ පිරිසකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන මූල්‍ය කාල සීමාව අවසානයේදී පූර්ණව පිරිසකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන සේ සළකනු ලබන අතර ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයට තක්සේරු කරනු ලැබේ.

අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තක්සේරු කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. වට්ටෝරු භාණ්ඩ විකිණීමේදී, එම වට්ටෝරු භාණ්ඩයන්හි ධාරණ මුදල අදාළ ආදායම පිළිගනු ලැබූ කාලසීමාවේ වියදමක් ලෙස සමාගම පිළිගනු ලබයි.

**2.5** බැරකම් සහ ප්‍රතිපාදන

අතීත සිදුවීමකින් මතුවන වත්මන් බැඳීමක් පියවීමේදී ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් එහි ප්‍රතිඵලය වේයැයි අපේක්ෂා කරනු ලබන විටදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ බැරකම් පිළිගනු ලැබේ. ණයකරු ඉල්ලා සිටි විටදි හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්වය දිනයේ සිට එක් වසරකට පසුව ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් සේ සලකනු ලැබේ.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති හා ඒ සඳහා විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සෑදිය හැකිවීම අවශ්‍ය කරනු ලබන විටකදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

**2.5.1** විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්

**(අ)** සැලසුම්ගත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති සූත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19- 'විශ්‍රාම ප්‍රතිලාභ' අනුකූලව සේවා නියුක්තියේ පළමු වසරේ සිට විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා පූර්ණ ප්‍රතිපාදනයක් වෙන් කරනු ලැබේ. මෙමප්‍රතිපාදනය ආයුගණකව තක්සේරු කරන්නක් නොවේ.

**ආ)** සැලසුම්ගත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාල ප්‍රඥප්ති සහ නියමයන් ප්‍රකාරව සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායක මුදල් වලට සුදුසුකම් ලබයි.

## 2.6 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

### 2.6.1 ආදායම් පිළිගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති සහ දරන ලද හෝ දැරීමට නියමිත ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම පිළිගනු ලැබේ. ලැබුණු ප්‍රතිෂ්ඨාව හෝ විකිණුම් වට්ටම් හෝ විකුණුම් බදු නොමැතිව ලැබිය යුතු දේවල සාධාරණ වටිනාකමට ආදායම ගණනය කරනු ලැබේ.

(අ) භාණ්ඩ විකුණුම

හිමිකාරිත්වය හා සාමාන්‍යයෙන් සබැඳුණු ප්‍රමාණයට අඛණ්ඩ කළමනාකාරිත්ව මැදිහත්වීමක් හෝ විකුණන ලද භාණ්ඩ පිළිබඳ සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගන්නා විට හා භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ පරිදාන ගැනුම්කරුට පවරා ඇති විටදී භාණ්ඩ විකණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලැබේ.

(ආ) ලාභ හා අලාභ

දේපල, පිරියත උපකරණ හා ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් අපහරණය කිරීමේදී පැන නගින ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාබ සහ අලාභ ඒ සඳහා අපහරණය මත ලැබෙන මුදල් වලින්, එවන් වත්කම්හි ධාරණ මුදල හා ආශ්‍රිත විකුණුම් වියදම්වලින් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ ගණන් දක්වා ඇත. ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වලට ආනුෂංගික ක්‍රියාකාරම්වලින් පැන නගින හා ද්‍රව්‍යමය නොවන සමාන ගනුදෙනු කාණ්ඩයකින් පැන නගින ලාභ හා අලාභ ශුද්ධ පදනමකින් එකතු කොට, වාර්තා කොට ඉදිරිපත් කරනු ලැබේ.

සහතික කරන ලද කුලි මුදල්වලින් මතුවන කිසියම් අලාභයක් එම අලාභය සිදුවූ වසරේදීම ගිණුම්වල දක්වනු ලැබේ. හොඳම ඇස්තමේන්තුව අලාභයක් පෙන්නුම් කරන්නේ නම්, ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

(ඇ) පොළී ආදායම

සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් උපචිත පදනමකින් පොළී ආදායම පිළිගනු ලැබේ.

(ඇ) අනෙකුත් ආදායම

සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් අනිකුත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

**2.6.2** වියදම් පිළිගැනීම

විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම වල ඉපැයීම් අතර සෘජු සම්බන්ධය පදනම් කර ගෙනය. ඵලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වා ගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ නඩත්තු කිරීමට දරන ලද සියලු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර තිබේ. විස්තීරණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, සමාගමේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණව ඉදිරිපත් කරන්නේය යන පදනමින් "වියදමේ ශ්‍රිතය" ක්‍රමවේදය යොදා ගෙන ඇත.

**2.7** කොටසක් සඳහා මූලික ඉපැයුම්/ (පාඩු)

තම සාමාන්‍ය කොටස් සඳහා සමාගම කොටසක් සඳහා මූලික ඉපැයුම්/ (පාඩු) දත්ත ඉදිරිපත් කරයි. කොටසක් සඳහා දත්ත ගණනය කරනු ලබන්නේ සමාගමේ සමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණීය ලාභය හෝ පාඩුව අදාළ කාල සීමාවේ නොපියවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ, භරිත සාමාන්‍යයෙන් බෙදීම මගිනි.

**2.8** සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හා අන්තර් කාලසීමා සංසන්දනීයභාවය වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කර ඇති සියලු වටිනාකම් සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන හා විස්තරාත්මක තොරතුරු ඇතුළුව සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කර ඇති විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්තන වසර සමග අනුකූලවීම පිණිස සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණය කර ඇත.

**2.9** වාර්තාකිරීමේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්වය පිළිබඳ සියලු ද්‍රව්‍යමය පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම් සලකා බලා, යෝග්‍ය අවස්ථාවන්හිදී අනාවරණය කර, මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

## වාර්තා කරන දිනය වන විට නිකුත් කර තිබූ එහෙත් බලාත්මක නොවූ නව ගිණුම්කරණ ප්‍රමිති

නිකුත් කරන ලද එහෙත් සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කරන දිනය දක්වා බලාත්මක නොවූ ප්‍රමිති පහත ලැයිස්තු ගත කර ඇත. මෙම ප්‍රමිති ලැයිස්තුගත කිරීම හා නිකුත් කරන ලද අර්ථ නිරූපණ, අනාගත දිනයකදී ආදේශ කළ විටදී හෙළිදරව් කිරීම්, මූල්‍ය තත්වය හෝ කාර්ය සාධනය මත බලපෑමක් ඇති කරනු ඇතැයි සමාගම සාධාරණව අපේක්ෂා කරන ඒවා වේ. ඒවා බලාත්මක වූ විටදී යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 9 - මූල්‍ය සාධන පත්‍ර

මූල්‍ය වත්කම් පිළිගැනීම, මැණීම හා වර්ගීකරණය සහ මූල්‍ය බැරකම් වර්ගීකරණය හා මැණීමට අදාළ අවශ්‍යතා, මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් පිළිගැනීමෙන් ඉවත්කිරීම හා සාධාරණ වටිනාකමට මනින්නේ කෙසේද යන්න පිළිබඳව වූ ගිණුම්කරණ ප්‍රමිති 39 හි විධිවිධාන ප්‍රතිස්ථාපනය කරන මූල්‍ය සාධන පත්‍ර ශ්‍රීලමූවාප්‍ර 9 ට එකතු කර ඇත.

ශ්‍රීලමූවාප්‍ර 9 බලාත්මක වන දිනය 2018 ජනවාරි 01 දක්වා කල් දමා ඇත.

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිති සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකරයි.

1. ශ්‍රීලමූවාප්‍ර 14- නියාමන විලම්බන ගිණුම්: බලාත්මක දිනය 2016 ජනවාරි 01
2. ශ්‍රීලමූවාප්‍ර 15 - පාරිභෝගිකයන් සමග කොන්ත්‍රාත්වලින් ආදායම: බලාත්මක දිනය 2017 ජනවාරි 01
3. ශ්‍රීලගිප්‍ර 16 හා ශ්‍රී.ල.ගි.ප්‍ර 41 සංශෝධන - ඵල දරණ ශාක-: බලාත්මක දිනය 2016 ජනවාරි 01

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම
**2017 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා**
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| *(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලින්)* | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| **සටහන 03 - ආදායම** | | | |
| දළ විකුණුම් | | **899,641,330.00** | 760,898,010.00 |
| අඩු කළා : තැරැව්කාර ගාස්තු සහ විකුණුම් වියදම් | | **(12,830,845.40)** | (11,193,314.81) |
| | | **886,810,484.60** | 749,704,695.19 |
| එකතු කළා : දේශීය විකුණුම් | | **48,781,399.74** | 26,025,504.62 |
| **එකතුව** | | **935,591,884.34** | **775,730,199.81** |
| **සටහන 04 - විකුණුම් පිරිවැය** | | | |
| අමු දළු මිලයට ගැණුම් | | **660,791,664.76** | 548,934,577.47 |
| නිෂ්පාදන පිරිවැය | | **181,213,223.15** | 154,405,500.09 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | | **78,819,360.05** | 69,025,010.62 |
| **නිෂ්පාදන පිරිවැය** | | **920,824,247.96** | **772,365,088.18** |
| **නිමි භාණ්ඩ සංචලන** | | | |
| වර්ෂය ආරම්භයේදි ශේෂය | | **71,415,673.60** | 66,409,164.12 |
| වර්ෂය අවසානයේදි ශේෂය | | **(110,622,693.80)** | (71,415,673.60) |
| **විකුණුම් පිරිවැය** | | **881,617,227.76** | **767,358,578.70** |
| **සටහන 05 -වෙනත් ආදායම්** | | | |
| විවිධ ආදායම් | | **7,557,839.19** | 6,292,116.31 |
| වත්කම් බැහැර කිරීම මත ලාභ | | **-** | 1,950,000.00 |
| ලියා හරින ලද | | | - |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන නිවැරදි කිරීම | | | 23,229,000.00 |
| **එකතුව** | | **7,557,839.19** | **31,471,116.31** |

*(ඉදිරියට...)*

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**
**2017 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
*(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)*

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| **සටහන 06 -පරිපාලන වියදම්** | | | |
| අධ්‍යක්ෂකගේ පාරිශ්‍රමික හා කාර්ය මණ්ඩල පිරිවැය | **6.1** | **17,437,821.66** | 14,823,259.62 |
| ගමන් වියදම්, යැපීම් දීමනා හා වාහන කුලියට ගැනීම | **6.2** | **3,529,323.29** | 1,504,401.56 |
| නඩත්තු වියදම්- වාහන හා උපකරණ | **6.3** | **3,047,263.22** | 3,737,854.22 |
| වෘත්තීමය ගාස්තු | **6.4** | **887,354.14** | 368,313.00 |
| රක්ෂණ හා බලපත්‍ර ගාස්තු | **6.5** | **1,240,893.45** | 894,182.29 |
| මුද්‍රණ ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු | **6.6** | **749,278.73** | 607,637.41 |
| අනෙකුත් පරිපාලන වියදම් | **6.7** | **5,554,127.93** | 8,572,265.17 |
| **එකතුව** | | **32,446,062.42** | **30,507,913.27** |

| | 2017 | 2016 |
|---|---|---|
| **සටහන 06.1 - අධ්‍යක්ෂවරුන්ගේ වේතන හා කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| කාර්ය මණ්ඩල වැටුප් | **5,713,842.23** | 4,657,581.58 |
| පාරිතෝෂික | **423,791.12** | 346,168.15 |
| දීමනා | **7,039,149.07** | 6,895,111.04 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | **577,578.29** | 655,831.07 |
| සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් | **806,348.09** | 561,764.11 |
| සේවක භාරකාර අරමුදල් දායක මුදල් | **192,205.97** | 143,352.48 |
| ප්‍රසාද දීමනා | **844,450.00** | 394,500.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | **691,500.00** | 421,500.00 |
| කාර්ය මණ්ඩල සුබසාධනය | **1,148,956.89** | 747,451.19 |
| **එකතුව** | **17,437,821.66** | **14,823,259.62** |

| | 2017 | 2016 |
|---|---|---|
| **සටහන 06.2 - ගමන් වියදම්, යැපීම් දීමනා හා වාහන කුලියට ගැනීම** | | |
| ගමන් වියදම්, යැපීම් දීමනා | **1,690,413.16** | 330,367.23 |
| කුලී ගාස්තු | **1,838,910.13** | 1,174,034.33 |
| **එකතුව** | **3,529,323.29** | **1,504,401.56** |

| | 2017 | 2016 |
|---|---|---|
| **සටහන 06.3 -කාර්යාල ගොඩනැගිල්ල, උපකරණ හා වාහන නඩත්තුව** | | |
| කාර්යාල ගොඩනැගිල්ල නඩත්තුව | **169,403.96** | 25,500.00 |
| කාර්යාල ගොඩනැගිල්ල නඩත්තුව | **248,811.33** | 171,364.72 |
| රථ වාහන නඩත්තු වියදම් | **1,090,378.59** | 1,480,298.27 |
| වාහන ඉන්ධන වියදම් | **1,532,269.34** | 2,060,691.23 |
| ටයර් අළුත්වැඩියාව | **6,400.00** | - |
| **එකතුව** | **3,047,263.22** | **3,737,854.22** |

| | 2017 | 2016 |
|---|---|---|
| **සටහන 06.4 - වෘත්තික ගාස්තු** | | |
| අනෙකුත් ගාස්තු | **559,209.14** | 368,313.00 |
| ලේකම් කටයුතු ගාස්තු | **328,145.00** | - |
| බදු ගාස්තු | **-** | - |
| **එකතුව** | **887,354.14** | **368,313.00** |

| | 2017 | 2016 |
|---|---|---|
| **සටහන 06.5 රක්ෂණ හා බලපත්‍ර ගාස්තු** | | |
| බලපත්‍ර සහ රක්ෂණ ගාස්තු | **287,670.91** | 172,227.81 |
| කාර්ය මණ්ඩල රක්ෂණ ගාස්තු | **953,222.54** | 721,954.48 |
| **එකතුව** | **1,240,893.45** | **894,182.29** |

| | 2017 | 2016 |
|---|---|---|
| **සටහන 06.6 -මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා තැපැල් ගාස්තු** | | |
| මුද්‍රණ වියදම් | **101,190.00** | 119,200.00 |
| මුද්දර ගාස්තු | **79,211.00** | 19,515.00 |
| පරිගණක ලිපි ද්‍රව්‍ය | **-** | - |
| අනෙකුත් ලිපිද්‍රව්‍ය | **568,877.73** | 468,922.41 |
| **එකතුව** | **749,278.73** | **607,637.41** |

*(Contd…)*

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම
**2017 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
*(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලින්)*

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| **සටහන 06.7 - අනෙකුත් පරිපාලන වියදම්** | | | |
| නෛතික ගාස්තු | | **240,250.00** | 130,755.00 |
| ක්ෂයවීම් | | **1,124,828.56** | 2,567,252.41 |
| ප්‍රධාන කාර්යාල වියදම් | | **-** | - |
| පරිත්‍යාග | | **676,343.05** | 378,059.50 |
| දුරකථන | | **706,327.07** | 605,060.75 |
| පුවත්පත් සහ වාර සඟරා | | **10,800.00** | 37,900.00 |
| කුලී ගෙවීම් | | **1,140,000.00** | 1,124,989.25 |
| විදුලි බිල්පත් | | **681,135.63** | 608,570.34 |
| නව ව්‍යාපෘති වියදම් | | **-** | 2,353,740.60 |
| අනෙකුත් උපයෝගිතා සහ සේවා | | **693,276.75** | 673,254.69 |
| සැපයුම් සහ භාණ්ඩ ඉල්ලීම් -වෙනත් | | **54,656.47** | 50,882.63 |
| කාර්ය මණ්ඩල පුහුණුව | | **223,077.40** | 41,800.00 |
| උත්සව අත්තිකාරම් ලියාහැරීම් | | **3,433.00** | - |
| චෙක් රෝල් ණය ලියාහැරීම් | | **-** | - |
| අධිභාරය | | **-** | - |
| **එකතුව** | | **5,554,127.93** | **8,572,265.17** |
| **සටහන 07- විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්** | | | |
| වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශන | | **-** | 58,750.00 |
| සංග්‍රහ වියදම් | | **169,968.00** | 283,325.29 |
| ලියා පදිංචිකිරීමේ ගාස්තු | | **40,953.74** | 135,636.03 |
| ප්‍රචාරක ගාස්තු | | **605,595.05** | 427,954.95 |
| **එකතුව** | | **816,516.79** | **905,666.27** |
| **සටහන 08- ශුද්ධ මූල්‍ය ආදායම** | | | |
| **08.1 මූල්‍ය ආදායම** | | | |
| ස්ථාවර තැන්පතු මත පොළිය | | **8,883,693.64** | 8,594,159.83 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොළිය | | **25,358.22** | 289,090.86 |
| සේවක ණය මත පොළිය | | **395,780.84** | 318,971.69 |
| ඉතුරුම් ගිණුම් පොළිය | | **77,771.75** | 55,924.96 |
| බීසීසී ලංකා ණය පොළිය | | **2,735,912.46** | 2,735,912.46 |
| **එකතුව** | | **12,118,516.91** | **11,994,059.80** |
| **08.2 මූල්‍ය වියදම්** | | | |
| බැංකු ගාස්තු | | **564,410.80** | 83,804.17 |
| අයිරා පොළිය | | **5,802,131.65** | 8,256,771.50 |
| කෙටි කාලීන ණය පොළිය | | **2,797,491.17** | 88,405.33 |
| **එකතුව** | | **9,164,033.62** | **8,428,981.00** |
| **ශුද්ධ** | | **2,954,483.29** | **3,565,078.80** |

*(ඉදිරියට...)*

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|

**සටහන 09 - බදුකරණය**

2011 අංක 22 දරන පනතින් සංශෝධනය කළ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 48(අ) වගන්තිය ප්‍රකාරව. 16 වන වගන්තියේ සඳහන් යම් කෘෂිකර්ම ව්‍යවසායකයින් ලැබූ ලාභ සහ ආදායම, පළමු උපලේඛනය අනුව 10%ක අනුප්‍රමාණයට අනුව ආදායම් බද්දට යටත් කළ යුතුය. අනෙකුත් ලාභ සාමාන්‍ය අනුපාතයට අනුව බද්දට යටත් වේ.

| | 2017 | 2016 |
|---|---|---|
| **9.1 ප්‍රවර්තන බදු වියදම්** | | |
| ප්‍රවර්තන වසර | **2,224,842.00** | 2,178,708.00 |
| පෙර වසරේ ආදායම් බදු ඌන/(අධි) ප්‍රතිපාදන | - | - |
| | **2,224,842.00** | **2,178,708.00** |
| **9.2 ගිණුම්කරණ ලාභය සහ ආදායම් බදු අතර සැසඳුම** | | |
| බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය/(අලාභය) | **31,224,399.85** | (11,239,588.85) |
| අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ආදායම සහ මුක්ත ආදායම | **(55,124,734.00)** | (55,547,104.00) |
| ඉඩ නොදුන් අයිතම සමාහාරය | **31,257,543.00** | 27,368,536.00 |
| ව්‍යාපාරයෙන් ගලපන ලද ලාභය/(අලාභය) | **7,357,208.85** | (39,418,156.85) |
| | | |
| අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ආදායම | **12,143,561.00** | 11,970,926.00 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | | |
| 32 වගන්තිය අඩුකිරීම් | **(6,824,032.00)** | (4,189,824.00) |
| යෝග්‍යතා ගෙවීම් | | - |
| බදු අයකළ හැකි ආදායම | **12,676,737.85** | 7,781,102.00 |
| | | |
| කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මත බදු 10% | **735,721.00** | - |
| අනෙකුත් ආදායම මත බදු 28% | **1,489,121.00** | 2,178,708.56 |
| **විලම්භිත බදු වියදම්** | | |
| අයකළ/ (ප්‍රත්‍යාවර්තනය) විලම්භිත බදු | **(501,450.70)** | - |
| **මුළු බදු වියදම්** | **1,723,391.30** | **2,178,708.56** |

**සටහන 10 - කොටසක් සඳහා ඉපැයුම් / කොටසක් සඳහා ලාභාංශ**

**10.1 කොටසක් සඳහා ඉපැයුම්**

කොටසක් සඳහා මූලික ඉපැයුම,පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබ ඇති වසර තුළ නිකුත් කරනු ලබන සාමාන්‍ය කොටස්වල හරිත සාමාන්‍යය සංඛ්‍යාවෙන් බෙදනු ලබන සාමාන්‍ය කොටස්කරුවන්ට ආරෝපණීය ලාභය මත පදනම් වේ.

| | 2017 | 2016 |
|---|---|---|
| වසර සඳහා ශුද්ධ ලාභය | **29,501,008.55** | 9,815,528.12 |
| හරිත කොටස් සාමාන්‍ය සංඛ්‍යාව | **4,637,507.00** | 4,637,507.00 |
| කොටසක් සඳහා මූලික ඉපැයුම් | **6.36** | **2.12** |

**10.2 කොටසක් සඳහා ලාභාංශ**

| | 2017 | 2016 |
|---|---|---|
| වසර සඳහා ලාභාංශ | | - |
| කොටස් සංඛ්‍යාව | 4,637,507.00 | 4,637,507.00 |
| කොටසක් සඳහා ලාභාංශ | **-** | **-** |

*(ඉදිරියට...)*

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**
**2017 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
*(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)*

**සටහන 11 - දේපළ, පිරියත හා උපකරණ**

| පිරිවැය | සින්නක්කර ඉඩම | ගොඩනැගිලි | පිරියත සහ උපකරණ | කර්මාන්තශාලා උපකරණ | පරිගණක උපකරණ | කාර්යාල උපකරණ | ලිබඩු සහ සවිකිරීම් | මෙවලම් | මොටර් රථ වාහන | වෙනත් | නොනිම් වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2016.04.01** දිනට පිරිවැය | 4,605,690.64 | 259,368,108.36 | 237,726,839.72 | 9,441,371.74 | 6,850,950.57 | 2,542,961.03 | 6,968,891.40 | 838,851.80 | 25,325,165.02 | 2,724,264.01 | 669,117.43 | 557,062,211.72 |
| එකතුකිරීම් | - | 210,117.50 | 6,024,947.40 | 764,192.70 | 497,364.20 | 477,250.00 | 881,643.00 | | - | 1,578,278.00 | 791,344.68 | 11,225,137.48 |
| බැහැරකිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| පැවරුම් | - | - | | - | - | - | - | - | - | - | | - |
| **2017.03.31 දිනට පිරිවැය** | **4,605,690.64** | **259,578,225.86** | **243,751,787.12** | **10,205,564.44** | **7,348,314.77** | **3,020,211.03** | **7,850,534.40** | **838,851.80** | **25,325,165.02** | **4,302,542.01** | **1,460,462.11** | **568,287,349.20** |

| සමුච්චිත ක්ෂයවීම | සින්නක්කර ඉඩම | ගොඩනැගිලි | පිරියත සහ උපකරණ | කර්මාන්තශාලා උපකරණ | පරිගණක උපකරණ | කාර්යාල උපකරණ | ලිබඩු සහ සවිකිරීම් | මෙවලම් | මොටර් රථ වාහන | වෙනත් | නොනිම් වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2016.04.01** දිනට සමුච්චිත ක්ෂයවීම | - | 116,989,875.79 | 166,146,103.83 | 4,322,079.64 | 4,444,628.30 | 1,862,599.40 | 3,998,625.02 | 519,457.51 | 25,281,173.76 | 1,103,948.67 | - | 324,668,491.91 |
| වත්මන් වසරේ ක්ෂයවීම | - | 12,402,191.07 | 11,705,968.49 | 1,054,705.93 | 519,997.85 | 202,133.06 | 711,284.32 | 62,009.55 | 43,991.26 | 374,646.43 | - | 27,076,927.96 |
| බැහැරකිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| **2017.03.31 දිනට සමුච්චිත ක්ෂයවීම** | **-** | **129,392,066.86** | **177,852,072.32** | **5,376,785.57** | **4,964,626.15** | **2,064,732.46** | **4,709,909.34** | **581,467.06** | **25,325,165.02** | **1,478,595.10** | **-** | **351,745,419.87** |
| **2017.03.31 දිනට ශුද්ධ පොත් වටිනාකම** | **4,605,690.64** | **130,186,159.00** | **65,899,714.80** | **4,828,778.87** | **2,383,688.62** | **955,478.58** | **3,140,625.06** | **257,384.75** | **-** | **2,823,946.91** | **1,460,462.11** | **216,541,929.33** |

*(Contd...)*

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**
**2017 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
*(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)*

| | | සටහන | 2017 | 2016 |
|---|---|---|---|---|
| **සටහන 12 - ජීවවිද්‍යාත්මක වත්කම්** | | | | |
| වර්ෂය ආරම්භයේදී | | | **2,981,298.74** | 2,937,798.74 |
| එකතුකිරීම් | | | **102,160.00** | 43,500.00 |
| වර්ෂය අවසානයේදී | | | **3,083,458.74** | **2,981,298.74** |
| | | | | |
| **සටහන 13 තොග** | | | | |
| ආහාර පාන | | | **19,815,416.36** | 18,368,990.06 |
| නිමි භාණ්ඩ | | | **110,622,693.80** | 71,415,673.60 |
| පාරිභෝජ්‍ය තොග | | | **700,943.48** | 489,515.05 |
| සාමාන්‍ය සහ වෙනත් | | | **2,241,155.59** | 2,111,317.01 |
| **එකතුව** | | | **133,380,209.23** | **92,385,495.72** |
| | | | | |
| **සටහන 14 - මූල්‍ය වත්කම්** | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | | | **261,401.64** | 261,401.64 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | | | **107,684,232.45** | 100,338,242.56 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | | | **7,903,418.82** | 7,287,196.32 |
| තේ ශක්ති අරමුදල: කරුණාකර පාද සටහන බලන්න | | | **50,000,000.00** | 50,000,000.00 |
| **එකතුව** | | | **165,849,052.91** | **157,886,840.52** |
| | | | | |
| **සටහන 15 - වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්** | | | | |
| වෙළඳ ණයගැතියෝ | | | **27,952,469.25** | 16,826,239.19 |
| කාර්ය මණ්ඩල ණයගැතියෝ | | | **12,479,569.25** | 11,191,987.95 |
| තැන්පතු | | | **3,948,474.34** | 3,522,474.34 |
| අත්තිකාරම් සහ ගෙවීම් | | | **18,958,838.47** | 19,424,908.88 |
| වල නොවන ශේෂ | | | **1,782,133.15** | 1,719,210.34 |
| අනෙකුත් හර ශේෂ | | | **56,662.98** | 56,662.98 |
| | | | **65,178,147.44** | 52,741,483.68 |
| අඩුකළා; බොල් ණය සඳහා ප්‍රතිපාදන | | | **(2,834,252.56)** | (2,834,252.56) |
| **එකතුව** | | | **62,343,894.88** | **49,907,231.12** |
| | | | | |
| **සටහන 16 - මුදල් හා මුදල් සමාන දෑ** | | | | |
| මහජන බැංකුව - | ගි.අංකය.204100140084885 මූලස්ථාන | | - | - |
| මහජන බැංකුව - | ගි/අංකය .204100130084961 මූලස්ථාන | | **32,788.80** | 426,760.02 |
| මහජන බැංකුව - | ගි/අංකය.204100140084911 මූලස්ථාන | | **73,048.10** | 229,518.10 |
| මහජන බැංකුව - | ගි.අංකය.060100110000681 මොරවක | | **1,717,634.76** | 1,275,325.30 |
| මහජන බැංකුව - | ගි/අංකය.060100100000592 මොරවක | | - | 1,979.14 |
| ලංකා බැංකුව | ගි/ අංකය. 0006065711 - නෙළුව | | **1,083.00** | 1,083.00 |
| ලංකා බැංකුව | ගි/අංකය 75958665 - පැලවත්ත | | **227,549.60** | 25,961.76 |
| ලංකා බැංකුව | ගි/අංකය 205604 - තවලම | | **15,000.00** | 6,764.60 |
| මහජන බැංකුව - | ගි/අංකය 256100110021039 - පිළිමතලාව | | **303,403.52** | 40,441.17 |
| අතැති මුදල් | | | **8.75** | 199,835.84 |
| මාර්ගස්ථ මුදල් | | | - | 89,123.00 |
| ඉතිරිකිරීමේ ගිණුම් - මහජන බැංකුව | | | **2,504,444.08** | 1,454,449.44 |
| **එකතුව** | | | **4,874,960.61** | **3,751,241.37** |

<u>පාද සටහන</u>
රු. මිලියන 50 ක් වන මෙම මුදල ණයක්/කල් බදු මුදලක් ලෙස තේ ශක්ති අරමුදලට ලබා දී ඇත. තේ ශක්ති අරමුදල සමග අදාළ ගිවිසුමේ කටයුතු මෙතෙක් අවසන් කර නොමැත.

*(ඉදිරියට ...)*

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම
2017 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
*(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)*

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|
| අවාසිදායක මුදල් හා මුදල් සමාන දෑ | | | |
| බැංකු අයිරාව | | **(17,535,366.13)** | (63,067,583.65) |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුළු මුදල් හා මුදල් හා සමාන දෑ** | | **(12,660,405.52)** | **(59,316,342.28)** |
| **සටහන 17 - ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| **නිකුත් කරන ලද සහ සම්පූර්ණයෙන් ගෙවන ලද** | | | |
| සාමාන්‍ය කොටස් 4,637,507 | | **46,375,070.00** | 46,375,070.00 |
| **එකතුව** | | **46,375,070.00** | **46,375,070.00** |
| **සටහන 18 - සංචිත** | | | |
| ප්‍රදාන- භාණ්ඩාගාර | | - | - |
| ප්‍රාග්ධන සංචිත | | **600,000.00** | 600,000.00 |
| ලාභ / අලාභ ගිණුම | | **418,352,204.8** | 388,851,196.22 |
| **එකතුව** | | 418,952,204.77 | **389,451,196.22** |
| **සටහන 19- විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් වටිනාකමේ සංචලන | | | |
| වර්ෂය ආරම්භයේදී | | **10,897,999.45** | 9,117,860.00 |
| වත්මන් සේවා පිරිවැය | | | |
| පොළී පිරිවැය | | **1,083,065.22** | 826,761.95 |
| ආයුගණක ලාභ/අලාභ | | **691,773.52** | 122,194.08 |
| වසර සඳහා ප්‍රතිපාදන | | **1,314,319.62** | 1,142,683.42 |
| පෙර වසර ගැලපීම් | | - | - |
| වසර තුළ ගෙවීම්- මුදලින් | | **(1,015,970.00)** | (311,500.00) |
| ගෙවිය යුතු | | - | - |
| වසර අවසානයේදී | | **12,971,187.81** | **10,897,999.45** |
| **සටහන 20 - බැංකු ණය - මහජන බැංකුව** | | | |
| කාරක ප්‍රාග්ධන ණය - මහජන බැංකුව | | **30,937,500.07** | |
| **සටහන 21 - ණය හිමියන් සහ උපචිත ගාස්තු** | | | |
| තේ දළු සැපයුම්කරුවෝ | | **35,670,658.92** | 18,430,891.50 |
| වෙළඳ ණය හිමියෝ | | **24,343,000.83** | 22,528,857.27 |
| සේවා කොන්ත්‍රාත්කරුවෝ | | **2,426,681.45** | 2,065,194.73 |
| කාර්ය මණ්ඩල ණය හිමියෝ | | **3,417,131.90** | 2,083,550.91 |
| උපචිත වියදම් | | **22,479,256.98** | 23,139,821.42 |
| හිමිකම් නොපෑ ශේෂ | | **467,639.60** | 424,166.59 |
| අවිනිශ්චිත සහ අනෙකුත් ණය | | **479,416.53** | 485,416.21 |
| **එකතුව** | | **89,283,786.21** | 69,157,898.63 |
| | | | - |
| **සටහන 22- බැංකු අයිරා** | | | |
| මහජන බැංකුව - ගි/අංකය 204100140084885 | | **17,264,253.34** | 63,067,583.65 |
| මහජන බැංකුව - මොරවක ගි.අංකය 06010010000059 | | **271,112.79** | |
| **එකතුව** | | **17,535,366.13** | **63,067,583.65** |
| | | | - |
| **සටහන 23- බැංකු ණය** | | | |
| **කාරක ප්‍රාග්ධන ණය - මහජන බැංකුව** | | **13,749,999.96** | **-** |
| **සටහන 24 - විලම්බිත බදු වගකීම්/(වත්කම්)** | | | |
| වර්ෂය අවසානයේදී | | **5,593,164.85** | 5,593,164.85 |
| ආදායම් ප්‍රකාශයට/ (ප්‍රකාශයෙන්) පවරන ලදී | | **(501,450.70)** | |
| **වර්ෂය අවසානයේදී** | | **5,091,714.15** | **5,593,164.85** |

| | සටහන | 2017 | 2016 |
|---|---|---|---|

**සටහන 25 - දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්**

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | **(533,258.32)** | (960,125.19) |
| වර්ෂය සඳහා ප්‍රතිපාදනය | **2,224,842.00** | 2,178,708.00 |
| | **1,691,583.68** | 1,218,582.81 |
| පෙර වසර සඳහා ගෙවීම් | **(874,000.00)** | |
| වර්ෂය සඳහා ගෙවීම් | | (894,000.00) |
| දළ | | |
| | **817,583.68** | 324,582.81 |
| <u>**බදු ණය**</u> | | |
| ආර්ථික සේවා ගාස්තු | **(2,149,011.56)** | |
| රඳවා ගැනීමේ බද්ද | **(53,115.49)** | (857,841.13) |
| **ශුද්ධ ගෙවිය යුතු/(ආපසු ගෙවිය යුතු)** | **(1,384,543.37)** | (533,258.32) |

**සටහන 26 - ප්‍රාග්ධන වියදම් සහ බැඳීම්**

| | | |
|---|---|---|
| ඉඩම් | **-** | - |
| ගොඩනැගිළි | **210,117.50** | 59,998,455.68 |
| පිරියත සහ යන්ත්‍ර | **6,024,947.40** | 24,732,556.64 |
| උපකරණ | **1,261,556.90** | 2,908,824.95 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | **881,643.00** | 629,784.50 |
| මෙවලම් | **-** | 153,088.90 |
| මෝටර් රථ | **-** | - |
| වෙනත් | **1,578,278.00** | 606,334.59 |
| නොනිමි වැඩ | **791,344.68** | 669,117.43 |
| **එකතුව** | **10,747,887.48** | 89,698,162.69 |

**සටහන 27 - අවිනිශ්චිත අවස්ථා**

**විභාගවෙමින් පවතින නඩු**

i) තමන් සේවයෙන් ඉවත් කිරීම අසාධාරණ බව පවසා තමන් නැවත සේවයේ පිහිටුවන ලෙස අයදිමින් ජී.හේමචන්ද්‍ර මහතා කොටපොළ කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් ගොනු කර ඇත (නඩු අංක LT/KP/34/18/07)

ii) තමන් සේවයෙන් ඉවත් කිරීම අසාධාරණ බව පවසා තමන් නැවත සේවයේ පිහිටුවන ලෙස අයදිමින් එල්.එස්. විජයමාන්න මහතා කොටපොළ කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් ගොනු කර ඇත (නඩු අංක LT/KP/34/19/07)

iii) 2010/2011 වසර සඳහා අදායම බදු ගෙවීමට අදාළව බදු අභියාචනා කොමිසම විසින් ලබා දුන් වාසිදායක තින්දුවට එරෙහිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. (බදු 08/2016)

iv) 2011/12 තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කරන ලද ආදායම් බදු තක්සේරුවට එරෙහිව සමාගම බදු අභියාචනා කොමිසමට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. (TAC/IT/ 060-2016)

**සටහන 28 - වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්**
මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපුම් හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය වන්නා වූ ද්‍රව්‍යමය සිදුවීම් වාර්තාකරණ දිනයෙන් පසුව සිදුව නොමැත.

*(ඉදිරියට...)*

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**
**2017 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
***(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි)***

**සටහන 29 - ආශ්‍රිත පාර්ශ්ව අනාවරණ**
සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ආශ්‍රිත සමාගම් සමග ගනුදෙනු සිදුකරනු ලැබුයේ 'අතේ දුරින්' පදනමිනි.

**29.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගනුදෙනු**
ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු සමාගමේ ක්‍රියාකාරකම් ඍජුව හෝ වක්‍රාකාරයෙන් සැලසුම් කිරීම, මඟ පෙන්වීම සහ පාලනය සඳහා බලතල සහ වගකීම් සහිත පුද්ගලයන් වේ.

ප්‍රධාන කළමනාකරණ පිරිස් වාර්තාකරණ අස්තිත්වයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සමන්විත වේ.

29.1.1. ප්‍රධාන කළමනාකරණ පිරිස් වල වන්දි ගෙවීම් ගිණුම් සටහන් 6 අනාවරණය කර ඇත.

29.1.2. වර්ෂය තුළදී ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ණය දී නොමැත.

29.1.3. සමීප පවුල් සාමාජිකයන් ඇතුළු ප්‍රධාන කළමනාකරණ කොටස්වල කොටස් දැරීම - කිසිවක් නොමැත

29.1.4. අනෙකුත් සමාගම්වල අධ්‍යක්ෂවරුන් වන සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම්
අධ්‍යක්ෂිකා ඉන්ද්‍රාණි සුගතදාස මිය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිණිය වේ.

**29.2. සමීප පවුල් සාමාජිකයන් සමග ගනුදෙනු**

සමීප පවුල් සාමාජිකයන් යනු සමාගම සමග සිදු කරන සිය ගනුදෙනුවලදී බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කරන හෝ බලපෑමට ලක්විය හැකි අයවළුන් වේ.

වර්ෂය තුළදී සමීප පවුල් සාමාජිකයන් සමග ගනුදෙනු කර නොමැත.

**29.3. පරිපාලිත සමාගම්, ආශ්‍රිත සමාගම් සහ හවුල් ව්‍යාපාර සමග ගනුදෙනු : කිසිවක් නොමැත**

*(ඉදිරියට...)*

**සටහන 30 - කර්මාන්ත ශාලා ඛණ්ඩ**

**30.1 විකුණුම්**

| | ප්‍රධාන කාර්යාලය | කළුබෝවිටියාන කර්මාන්තශාලාව | දැරංගල කර්මාන්තශාලාව | හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව | මැණික්දිවෙල කර්මාන්තශාලාව | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු. | රු. |
| දළ විකුණුම් | - | 481,417,820.00 | 211,088,740.00 | 108,224,500.00 | 98,910,270.00 | 899,641,330.00 |
| අඩුකළා: තැරව්කාර ගාස්තු හා විකුණ | - | (5,769,851.09) | (3,493,357.64) | (1,824,936.57) | (1,742,700.10) | (12,830,845.40) |
| | - | 475,647,968.91 | 207,595,382.36 | 106,399,563.43 | 97,167,569.90 | 886,810,484.60 |
| එකතුකළා: දේශීය විකුණුම් | 21,388,590.00 | 21,418,306.07 | 4,899,872.67 | 294,979.00 | 779,652.00 | 48,781,399.74 |
| **එකතුව** | **21,388,590.00** | **497,066,274.98** | **212,495,255.03** | **106,694,542.43** | **97,947,221.90** | **935,591,884.34** |

**30.2 විකුණුම් පිරිවැය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු. | රු. |
| මිලදීගත් දළු | - | 326,865,961.72 | 172,094,113.15 | 91,937,499.29 | 69,894,090.60 | 660,791,664.76 |
| **නිෂ්පාදනය කිරීමේ පිරිවැය** | | | | | | |
| නිෂ්පාදන පිරිවැය | 18,118,817.07 | 55,265,408.78 | 43,284,163.18 | 37,804,548.79 | 26,740,285.33 | 181,213,223.15 |
| පොදු ගාස්තු | 1,627,106.72 | 28,954,708.07 | 21,122,036.82 | 10,956,160.71 | 16,159,347.73 | 78,819,360.05 |
| | **19,745,923.79** | **411,086,078.57** | **236,500,313.15** | **140,698,208.79** | **112,793,723.66** | **920,824,247.96** |
| එකතුකළා: ආරම්භක තොග | 610,599.03 | 34,175,254.05 | 17,075,813.81 | 8,219,841.74 | 11,334,164.97 | 71,415,673.60 |
| අඩුකළා: පියවීම් තොග | (600,399.63) | (42,152,309.55) | (46,079,098.82) | (7,112,401.40) | (14,678,484.40) | (110,622,693.80) |
| **එකතුව** | **19,756,123.19** | **403,109,023.07** | **207,497,028.14** | **141,805,649.13** | **109,449,404.23** | **881,617,227.76** |

*(ඉදිරියට...)*

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**
**2017 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**
***(සියලු මුදල් ප්‍රමාණ දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලින්)***

| | 2017 | 2016 |
|---|---|---|
| **01. වෙළඳ සහ වෙනත් ලැබීම්** | | |
| **1. 1 වෙළඳ ණයගැතියෝ** | | |
| දළු සැපයුම්කරුවන්ගේ ණය | **1,507,619.45** | 1,383,597.15 |
| දළු සැපයුම්කරුවන්ගේ ණය මුදල් | **493,333.42** | 74,999.98 |
| මිලදී ගත් දළු ප්‍රවාහන ණය | **39,053.10** | 221,666.63 |
| පොහොර ණයගැතියෝ | **2,363,784.54** | 1,828,812.05 |
| වෙළඳ ණයගැතියෝ | **23,548,678.74** | 13,317,163.38 |
| **උප එකතුව** | **27,952,469.25** | **16,826,239.19** |
| | | |
| **1 .2 කාර්ය මණ්ඩල ණයගැතියෝ** | | |
| චෙක්රෝල් ණය | **90,967.76** | 67,226.08 |
| චෙක්රෝල් ණය මුදල් | **7,825.06** | 11,825.06 |
| ආපදා ණය | **11,141,976.70** | 10,477,937.07 |
| උත්සව අත්තිකාරම් | **1,238,799.73** | 634,999.74 |
| **උප එකතුව** | **12,479,569.25** | **11,191,987.95** |
| | | |
| **1.3 තැන්පතු** | | |
| තැන්පතු ලැබීම් | **3,534,474.34** | 3,174,474.34 |
| බංගලාව මූලික මුදල් ගෙවීම | **414,000.00** | 348,000.00 |
| **උප එකතුව** | **3,948,474.34** | **3,522,474.34** |
| | | |
| **1.4 පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්** | | |
| අයකර ගත යුතු උ.ගෙ.බද්ද | **4,389.00** | 3,982.00 |
| මිලදීගත් දළු සුහසාධන සංගමය | **13,660.00** | 13,660.00 |
| සභාපතිගේ බංගලාව | - | 81,633.93 |
| හදිසි අවස්ථා අත්තිකාරම් | - | 25,000.00 |
| හිනිදූම හිල්ස් තේ කර්මාන්ත ශාලාව | - | 83,976.70 |
| කම්කරු උත්සව අත්තිකාරම් | - | 376,000.00 |
| විවිධ සේවා සමූපකාර සමිතිය - අගලවත්ත | **249,435.65** | 249,435.65 |
| පොහොර ණය | **114,232.55** | 75,840.04 |
| හඳුනා නොගත් | | - |
